# නියමුවා

> “එය ධනපති ආණ්ඩුවක් නිසා පාන් දීම එයට කළ නොහැකිය. එයට දිය හැකි හොඳම දෙය, ‘දක්ෂ ලෙස සංවිධානය කළ දුර්භික්ෂය’ වන්නේය. නමුත් ජනතාව දුර්භික්ෂය පිළි නොගනු ඇත. පාන් තිබෙන බවත්, එය ලබා ගත හැකි බවත්, එහෙත්, එය ලබා ගත හැක්කේ ප්‍රාග්ධනයේ හා ඉඩම් හිමිකමෙහි ශුද්ධත්වයට ගරු නොකරන ක්‍රමවලින් පමණක් බවත්, ඔවුන් ඉගෙන ගනු ඇත. සමහර විට ඉතා ඉක්මනින් ඔවුන් එය ඉගෙන ගනු ඇත.”
>
> ලෙනින්
>
> තෝරාගත් කෘති, 5වැනි වෙළුම, 19 පිටුව

ISSN 1391 - 1031 | 2024 මාර්තු 28 වෙළුම | 07 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=

# නව ජාතික පිබිදීමක් රට තුළ ගොඩනැගිය යුතුයි

**පොදු අපේක්ෂකයින් වීමට සිහින මවන සියලු දෙනා පාලනයට සම්බන්ධ වී සිට රට බංකොලොත් කිරීමට වගකිවයුතු අය බවත් පැරණි මාවතේම යන ඔවුනට රට ගොඩනැගීමට නොහැකි බවත් රටට අවශ්‍ය ගැඹුරු වෙනස්කම් සිදු කරමින් රට ගොඩනැගීමේ දැක්මක් ඇත්තේ මාලිමාවට බවත් පෙන්වා දෙන ජාතික ජන බලවේගය, මඩ අවලාද කුමන්ත්‍රණ පරාජය කරමින් ලෝකය ඉදිරියේ රට ගෞරවනීය තත්වයකට ඔසවා තැබිය හැකි ආර්ථිකයක් ගොඩනගන නව ජාතික පිබිදීමක් රට තුළ ගොඩනැගිය යුතු බව අවධාරණය කරයි.**

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ජාතික ජන බලවේගය වෙනුවෙන් මෙම අදහස් පළ කළේ පසුගිය 29වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ ටිල්වින් සහෝදරයා මෙසේද පැවසීය.

මේ හැමෝම පරණ පාරේ යන අය. ඒ අයට රට ගොඩනඟන්න බැහැ. රටට අවශ්‍ය ගැඹුරු වෙනස්කම් කරමින් රට ගොඩනැගීමට ඉන්නේ, අලුත් දේශපාලන සංස්කෘතියක් තිබෙන, කැපකිරීම් කළ හැකි දැක්මක් තිබෙන මාලිමාව පමණයි.

මෑත කාලයේ පැවැත්වූ සියලුම ජනමත සමීක්ෂණවලින් ජාතික ජන බලවේගය ඉදිරියෙන් සිටින බව ඔප්පු වීමත් සමග බොහෝ දෙනා කලබල වෙලා. අපි කරන දේවල් කොපි කරන්න උත්සාහ කරනවා. සජිත් ප්‍රේමදාසගේ පක්ෂය මෑත කාලයේ ආණ්ඩුව ගැන විවේචන එල්ල කරනවා වෙනුවට ජාතික ජන බලවේගයට ප්‍රහාර එල්ල කරනවා. අනෙක් කුඩා කල්ලි කණ්ඩායම් පවා එහෙමයි. මේ හැමදෙනාටම අභියෝගය වී තිබෙන්නේ ජාතික ජන බලවේගය බව එයින් යළි යළිත් තහවුරු වෙනවා. ඒ නිසා අපට සතුටක් දැනෙනවා. අලුත් සන්ධාන හැදුවත්, අලුත් නම් දැම්මත්, ඉන්නේ පරණ මිනිස්සුමයි. ඔවුන් අලුතින් කියාගෙන යන්නේ “මේක අලුත් අත්හදා බැලීම් කරන්න කාලයක් නොවෙයි” කියලා. එකෙන් කියන්නේ පරණ කට්ටියම තියා ගන්න කියලා. මහින්ද රාජපක්ෂ, රනිල් වික්‍රමසිංහ, සජිත් ප්‍රේමදාස ඇති වෙන්නම අත්හදා බලලයි තිබෙන්නේ. ඒගොල්ලෝ ෆේල්, රට විනාශ කළ අය බව කවුරුත් දන්නවා. අලුතින් අත්හදා බලන්න දෙයක් නැහැ.

මේ කණ්ඩායම් විකාරරූපී දේශපාලන රංගනයන්ගෙන් සමන්විත සන්ධාන ගොඩනඟමින් තිබෙනවා. අලුත් පෙනුමක් පෙන්වා පරණ මිනිසුන්ව ජනතාව නැවත වතාවක් රවටන්න උත්සාහ කරනවා. රට බංකොලොත් කළ අයම සුන්දර රටක් හැදීම පිළිබඳව ජනතාවට පොරොන්දු දෙමින් ඉන්නවා. පසුගිය කාලයක් තිස්සේ එකට ආණ්ඩුවේ සිටි අයත් වැඩපිළිවෙළවල් ඉදිරිපත් කරමින් වෙනත් සාකච්ඡා ඇති කර, ජනතාව නොමඟ යවන්න උත්සාහ කරනවා. ඡන්ද මඟහැර යන්න විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම වගේ කතා කියමින් ඉන්නවා. අපි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න දිගටම අරගල කරමින් බොහෝ දේවල් කැප කළ අය. විධායක ජනාධිපති ධුරය අහෝසි කර, ජනතා පරමාධිපත්‍යය බලය තහවුරු කළ හැක්කේ ජාතික ජන බලවේගයේ පාලනයකට පමණයි. ජනාධිපතිවරණය ජයග්‍රහණය කර, මහ මැතිවරණයෙන් ශක්තිමත් ආණ්ඩුවක් පිහිටුවා අලුත් ව්‍යවස්ථාවක් හඳුන්වා දෙමින් ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කර විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න අපි පියවර ගන්නවා.

චෞර කල්ලියක් අත තිබූ බලය පොදු ජනතාව අතට මාරු වන බව ඒ සියලු දෙනාට පැහැදිලි වී තිබෙනවා. මේ නිසා රනිල් වික්‍රමසිංහ ව්‍යවස්ථාව කඩමින් විවිධ අවස්ථාවල ක්‍රියාකර තිබෙනවා. පොලිස්පතිවරයා පත්කර ගැනීමේදී කථානායක ක්‍රියාකළ ආකාරය ව්‍යවස්ථාවට පටහැණි බව හෙළි වී තිබෙනවා. ඡන්දය කිට්ටු වෙන කොට තවත් කුමන්ත්‍රණ, විවිධ උපක්‍රම පාවිච්චි කරනවා වගේම හොරා කෑ සල්ලි පාවිච්චි කර, විවිධ අවලාද අපට විරුද්ධව ක්‍රියාත්මක කිරීමට සූදානම් වෙන්නේ මේ නිසයි.

මේ අවුරුද්දේ සැප්තැම්බර් අග හෝ ඔක්තෝබර් මුල ජනාධිපතිවරණය පවත්වන්න මැතිවරණ කොමිසම ක්‍රියාකළ යුතු වෙනවා. මැතිවරණයක් එනකොට අපේ රටේ ජනතාව මේ දුෂ්ට පාලනය වෙනස් කර ගැනීම සඳහා විශාල බලාපොරොත්තුවකින් සිටිනවා. බෙහෙත් නැතිකම, බාල බෙහෙත් ප්‍රශ්න වගේම අධ්‍යාපන ප්‍රශ්න, දැවැන්ත බදු බර වගේ තත්වයන් වෙනස් කර, තමන්ට ජීවත් විය හැකි රටක් ගොඩනඟාගන්න ජනතාව බලාගෙන ඉන්නවා. ජනතාව දූෂිත පාලනය වෙනස් කිරීම වෙනුවෙන් පෙළගැසී සිටිනවා. ආර්ථික සංවර්ධනය තිබෙන, සාධාරණත්වය තිබෙන, සමාජයක් ගැන ජනතාව බලාපොරොත්තු තබාගෙන ඉන්නවා. තමන්ට ලැබෙන කුඩා වාසි පැත්තකින් තබා සමාජයේ ගැඹුරු වෙනස්කම් වෙනුවෙන් මාලිමාව සමග අත්වැල් බැඳගෙන ජනතාව පෙරට එමින් සිටිනවා.



බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ හමුව - 2024.02.25

## 03 ජනතාව දේශපාලන වෙනසක් ඉල්ලා...

තැන් තැන්වල විවිධ වෙස්මුහුණු බැඳගෙන වෙන්ව සිටි කණ්ඩායම් දැන් එකගොඩකට එකට එකතු වෙනවා. කඳවුරු දෙකේ ද්වන්ධ දේශපාලන සටන තමයි මෙවර ජනාධිපතිවරණ සටන....



## 05 නව නිදහස් අරගලයක්...

එක් අතකින් දැන් ලංකාවට ආර්ථිකයක් නැත. එබැවින් හෙට දවසේ ගොඩනඟන මහජන පාලනයක අභියෝගය වන්නේ වට්ටවන ලද ආර්ථිකය යළි ගොඩගැනීමය. ශක්තිමත්, ස්ථාවර ආර්ථිකයක් නිර්මාණය කිරීමත්...



## 09 අපි කුමක් කරමුද?...

ඉකුත් සියවස මුල් භාගයේ දී ෆොන්ටමාරා නම් වූ එම ප්‍රත්‍යන්ත ඉතාලි ගම්මානයෙහි වැසියන් අත් විඳි සූරාකෑම, රැවටීම හා ඔවුන්ගේ ජීවිත තුළින් ඉවත නොයන සේ කිඳා බැස ගත්තා වූ දුගීභාවය මෙම විසි එක්වන සියවසට ආගන්තුක වූ ...



තරුණ.................................... 04
ජාත්‍යන්තර.......................... 06
ආර්ථිකය ............................ 07
කාන්තා.................................. 08
විශේෂාංග........................... 10
වේදිකාව.................................11

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

## හෙද හෙදියෝ සෞඛ්‍ය අමාත්‍යාංශය වටලති



'පොරොන්දු වූ නිදිවර්ජිත, අනතුරු හා ප්‍රවාහන දීමනාව ලබාදෙනු, නිල ඇඳුම් හා ඉන්වෙන්ට්‍රි දීමනාව වැඩිකරනු, නිදහස් සෞඛ්‍යය සුරකිනු, සොරාගත් හිඟ වැටුප් වහා ලබාදෙනු, ජනතාව සමග ගැටුම් අවුළන ආණ්ඩුවේ කුමන්ත්‍රණ වහා නවතනු, සියලු සෞඛ්‍ය සේවකයින්ගේ අනන්‍ය ඉල්ලීම් වහා ලබාදෙනු' යන ඉල්ලීම් මුල්කරගෙන සමස්ත ලංකා හෙද සංගමය මගින් පසුගියදා සෞඛ්‍ය අමාත්‍යාංශ්‍ය ඉදිරිපිටදී දැවැන්ත විරෝධතාවයක් පැවැත්වීය. ජාතික රෝහල් පරිශ්‍රයේ සිට සෞඛ්‍ය අමාත්‍යාංශය දක්වා පෙළපාලියකින් පැමිණීමෙන් පසු මෙම උද්ඝෝෂණය පැවැත්විණි. ඉන් පසුව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා මගින් සාකච්ඡාවක් ලබාදීමෙන් පසු එම ඉල්ලීම් සඳහා එකඟතාවය පළ කෙරුණු බවත් එම ඉල්ලීම් ලබාගැනීම සඳහා අඛණ්ඩව මැදිහත් වන බවත් මෙහිදී සමස්ත ලංකා හෙද සංගමයේ සභාපති සභාපති එස්.බී. මැදිවත්ත සහෝදරයා පැවසීය.

## අපදා කළමණාකරණ අමාත්‍යාංශය ඉදිරිපිට රාජ්‍ය සේවක විරෝධතා




ආපදාවකට ලක්වූ නිවසක්, ව්‍යාපාරික ස්ථානයක් වෙනුවෙන් ලබාදුන් රු. ලක්ෂ 25 ක මුදල ලක්ෂ 5 දක්වා අඩුකිරීම, යළි පදිංචි කිරීමක් සඳහා ලබාදුන් ලක්ෂ 16 ක මුදල ලක්ෂ 5 දක්වා අඩුකිරීම, ආපදා සහන සේවා රාජකාරීවල නිරත 117 දෙනෙකු සේවයෙන් ඉවත් කිරීම, ආපදා සහන සේවා මධ්‍යස්ථානය අඩපණ කිරීම යන කරුණු මුල්කරගෙන අපදා සහන අමාත්‍යාංශය ඉදිරිපිට එම සහන සේවා නිලධාරීහු විරෝධතාවයක නියැලුණහ. සංවර්ධන සේවා නිලධාරී සංගමයේ ලේකම් චන්දන සූරියආරච්චි, සමස්ත ලංකා ආපදා සහන සේවා නිලධාරී සංගමයේ සභාපති උපුල් කුමාර යන සහෝදරවරුන් මෙම උද්ඝෝෂණයේදී අදහස් දැක් වූ අතර මෙහිදී චන්දන සූරියආරච්චි සහෝදරයා සඳහන් කළේ ආණ්ඩුවේ වෑයම රාජ්‍ය සේවය හැකිළීම බවත් ආණ්ඩුව මෙලෙස ජනතාවගෙ ආපදාවකදී දෙන සහන කප්පාදුව සඳහා ගෙනෙන ලද කැබිනට් තීරණය අනිවාර්යයෙන් හකුළා ගැනීමට සියලු රාජ්‍ය සේවකයින් පෙළගස්වන බවත්ය.

## විදුහල්පතිවරු විරෝධතාවේ




උසස්වීම් ගැටලුව, වැටුප් විෂමතාව, මාණ්ඩලික සේවයේ ගැටලුව, දරුවන්ගේ පාසල් උපකරණ මිල ඉහළ යාම, අධ්‍යාපනයේ බර දෙමව්පියන් මත පටවමින් දෙමව්පියන්ගෙන් මුදල් අයකිරීම ආදී කරුණු ගණනාවක් මුල්කරගෙන් විදුහල්පති සේවා සංගමය පසුගියදා බත්තරමුල්ල අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපිට විරෝධතාවයක් පැවැත්වූ අතර මේ සඳහා රට පුරා විදුහල්පතිවරු විශාල පිරිසක් සහභාගි වූහ. මෙහිදී විදුහල්පති සේවා සංගමයේ ලේකම් අනිල් අබේගුණවර්ධන සහෝදරයා ප්‍රකාශ කළේ රටේ පාසල් අධ්‍යාපනය දැවැන්ත අර්බුදයකට මුහුණ දී ඇති බවත් මේ සඳහා පාලකයින්ගෙන් කිසිදු විසඳුමක් තවමත් ලැබී නොමැති බවය. ආණ්ඩුවෙන් යහපත් පිළිතුරක් නොලැබෙන්නේ නම් සමස්ත විදුහල්පති සේවයම මෙම විරෝධතාවයන් සඳහා පෙළගැස්වීමට කටයුතු කරන බවද ඔහු අවධාරණය කළේය.

## විශ්‍රාමිකයින්ගෙන් කොළඹදී විරෝධතා



රාජ්‍ය සේවකයින් සඳහා වැඩිකළ දීමනාවෙන් 70%ක් විශ්‍රාමිකයින්ට ලබා ගැනීම, චක්‍රලේඛ මගින් අත්හිටවූ විශ්‍රාම වැටුප වහාම ගෙවීම, ගුරු විදුහල්පතිවරුන් සඳහා හිමි වැටුපට අදාළ විශ්‍රාම වැටුප විශ්‍රාමිකයින් සඳහා ලබාගැනීම, අග්‍රහාර රක්ෂණ ක්‍රමය 2016ට පෙර විශ්‍රාමිකයින්ටත් ලබාගැනීම ආදී මූලික කරුණු ගණනාවක් මුල්කරගෙන විශ්‍රාමිකයින්ගේ සංගම් එකමුතුව පසුගියදා කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී විරෝධතා උද්ඝෝෂණයක් පැවත්වීය. මෙම විරෝධතා උද්ඝෝෂණය සඳහා ගුරු විදුහල්පති, ආරක්‍ෂක සේවා, ඇතුළු විශ්‍රාමික සංගම් ගණනාවක් එක්වී සිටියේය.

*මාලිමාවේ මහනුවර දිස්ත්‍රික් කාන්තා සමුළුව - 2024.02.10*

## පාලකයින් අනාගත පරම්පරාව විනාශ කරද්දී ගැහැනුන්ට තවත් ඉවසිය නොහැකියි

### ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයා



මේ "ගැහැනු අපි එක මිටට" එකතු වෙන ජාතික ව්‍යාපාරය මීට පෙර යම් යම් අවධිවල වෙනත් හැඩවලින්, වෙනත් නම්වලින් ආවා. සමාජය වෙනස් කරන්නත් ඒ සඳහා කාන්තාවන් සංවිධානය කරන්නත් ආරම්භයක් අරගෙන තිබුණා. ගෙවිලියන්, ආචාර්යවරුන්, වෛද්‍යවරුන්, විවිධ රාජ්‍ය සේවයේ නියැලුණු, වතු ක්ෂේත්‍රයේ නියැලුණු, පෞද්ගලික සේවයේ අය, විශ්‍රාමික හමුදා සේවයේ නියැලුණු, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සියලුම සමාජ විවිධ ස්ථරවල පීඩිත හා ප්‍රගතිශීලී ගැහැනු අද මේ සමුළුව නියෝජනය කරනවා.

ලක්ෂාන්ත අතුකෝරල කවියා විසින් ලියූ කවියක් තිබෙනවා, "වැඩ ඇරී වැඩට යති, ගැහැනු" කියලා. මෙතන සිටින බොහොමයක් ගැහැනු වැඩ ඇරී වැඩට යන අය. ඒ කියන්නේ දවසේම වැඩවල යෙදෙන අය. වී.අයි. ලෙනින් සහෝදරයා කාන්තාවන් සම්බන්ධව ලියන ලද 'කාන්තා විමුක්තිය' පොතේ තිබෙනවා, 'කාන්තාවට විමුක්තිය ලැබෙන්න නම්' වැඩ ඇරී වැඩට යන ගැහැනු කියන කතාව ඉවර කරන්න ඕනෑ කියලා. අවුරුදු 76ක් අපි භුක්ති විඳපු දේ තමයි 'වැඩ ඇරී වැඩට යන ගැහැනු' ලෙස නිර්මාණය වෙන්නේ. අපි ජාතික ජන බලවේගයේ අපි හැමෝම එකතු වෙලා නිර්මාණය කර ගනිමු "වැඩ ඇරී ගෙදර යන ගැහැනු". ලෙනින් සහෝදරයා කාන්තා විමුක්තිය පොතේ කියනවා, ගෙදර ෆැක්ටරි තුනක් තිබෙනවා. රෙදි ෆැක්ටරිය, ආහාර ෆැක්ටරිය, දරුවන් රැක බලා ගැනීම. මේ ෆැක්ටරි ගෙදරින් එළියට ගන්න ඕනෑ. එතකොට ආදරය, සෙනෙහස, බැඳීම් තිබෙන නිවසක් ඉතිරි වෙනවා.

රුවන් බන්දුජීව කවියාගේ "මීළඟ මීවිත" පොතේ 'කුණ්ඩලකේශී' කවි පෙළේ බිරිඳක් සැමියෙකුගේ සියලුම ක්‍රියාවන් ඉවසමින්, ආදරයෙන් සැලකීමත් ඔහු තම දියණිය විනාශ කළ මොහොතේ ඇය මිනීමරු ගැහැනියක් වෙන ආකාරය තිබෙනවා. අද අපේ පාලකයෝ රටේ දරුවොත් විනාශ කරලා තිබෙන්නේ. මේ යූ.එන්.පී., ශ්‍රී ලංකා මේ විවිධ පක්ෂවල නායකයන්ට ජනතාව ආදරය කළා. ඔවුන් අපේ දරුවො ටික ටික විනාශ කළා; සොරකම් කළා; ගස් ටික, වැලි ටික විනාශ කළා. ඒත් ජනතාව ඉවසුවා. දැන් අපේ අනාගත දරුවන්ටත් අත තබලා තියෙන්නේ. දැන් රටේ ගැහැනු තවදුරටත් ඉවසනවාද? තවදුරටත් මේ පාලකයන්ට ඉඩ දෙනවාද? මේ සමුළුවේදී තීරණයක් අරගෙන යන්න. "ගැහැනු අපි එක මිටට" නැගිටිනවා හැර, මේ පාලකයන් විනාශ කරන්න වෙන උත්තරයක් අපට නැහැ. මහනුවර දිස්ත්‍රික්කයේ මෙතනට රැස්වූ සියලු ප්‍රගතිශීලී, පීඩිත සහෝදරියන්ට ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරනවා.

## රට නව පුනරුද යුගයකට අවතීර්ණ කළ යුතුයි

### ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික සමන්ත විද්‍යාරත්න සහෝදරයා



මාතරින් ඇරඹුණු ගැහැනු සමුළුවෙන් අපේ විරුද්ධවාදීන් සලිත වෙන්න පටන් ගත්තා. කාන්තාවන්ට ජවයක් එන්න පටන් ගත්තා. පණිවිඩයක් රටට දුන්නා, රටේ අනාගතය බාර පොදු ජන යුගයකටයි; ජාතික ජන බලවේගයටයි. කාන්තාවන්ට මේ සමාජයේ නිසි තැන, වටිනාකම දුන්නේ නැහැ. දේශපාලන අයිතිය පිරිමියා අතේ තබා ගත්තා. ජාතික ජන බලවේගයේ රජයක් යටතේ කාන්තාවන් හා පිරිමින් හරි හරියට එකතු වී මේ රට අනිවාර්යයෙන් ගොඩනගනවා. දේශපාලනයේ කාන්තාවන්ට තැනක් නැතත් සාහිත්‍යයේ තැනක් තිබුණා.

*පෙරදිග ලෝකයේ බැබලුණු මුතු ඇටය - මුළු රට කොල්ල කෑ හොරු රැළකට යටය*

*බෝගම්බරදී ගැහැනුන් අද එක මිටය - හොරු පරදන බවට අද නම් එය අත උඩය*

'උඹලා මෙතෙක් කලක් දීපු දස වද තුරන් කර දාන්න ජාතික ජන බලවේගය වටා ඉන්න සකලවිධ බලවේග සූදානම්' බව කියන පණිවිඩය අද පාලකයන්ට දී තිබෙනවා. මීට දවස් හයකට කලින් නිදහස් දිනේදි, රනිල් වික්‍රමසිංහ ජාතික කොඩිය ඉස්සුවා. මේ කොඩිය උස්සන්න ලෝකයෙන් ණය, ආධාර හැටියට ගෙනාව සල්ලි, වැට් ගහලා, බදු ගහලා ගත්ත සල්ලි කෝටි 30කට ආසන්න මුදලක් වැය කළා. රට මේ තත්වයට පත්වී ඇති මොහොතක මෙවැනි උත්සවයක් කරන්න ඕනෙද?

මීට වසර 34ක පෙර බූස්ස කඳවුරේ සිටි කෙනෙක් පොතක් ලිව්වා, "ඒත් අපි පියාඹමු" කියලා. ඒ පොතේ අද වෙන දේ දැකලා මේ විදිහේ කවියක් ලියුවා.

*සිංහයා වුණත් නුඹ තිරිසන් සතෙකි කැලේ - කඩුවක් අරන් කොඩියක් මැද මොකද බොලේ*

*ගුවනේ ලෙලෙන අසිපතකින් කිමද පලේ - බැහැපන් බිමට සිඳපන් ගෙල ද්‍රෝහි රැලේ*

මේ රටේ අභිමානවත් බව සිංහයාගෙන් පිළිබිඹු වෙනවා. කඩුවෙන් එඩිතරභාවය. අපිට තිබෙන කඩුව තමයි හිත, ධෛර්යය, වචන. ඒ සියල්ල මේ දුෂ්ට පාලකයෝ පන්නලා දමන්න පාවිච්චි කරන්න කියලා තමයි ඒ කිවුවේ. තුන්වේල කන්න නැහැ. අධ්‍යාපන නිදහස, සෞඛ්‍ය නිදහස, අදහසක් ප්‍රකාශ කිරීමේ නිදහස නැති කරලා. අපට මේවා දිනාගන්න සිදුවෙලා. රටේ නායක රනිල් ලෝකෙන් හිඟාගෙන ඇවිත්, රාජාසන කතාවෙදි කියනවා උත්සව සමයට පමණක් හාල් කිලෝ 20ක් දෙනවා කියලා. මේ ඡන්දයක් ඉදිරියේ නායකයෙක් කරන රාජාසන කතාව. ඕව දෙන්නේ අපි බලවත් නිසා, අපි දුර්වල වුණා නම් හාල් කිලෝ 20ත් නැහැ; අස්වැසුමත් නැහැ. අවුරුදු 76ක් උන් අපිව රැවැට්ටුවා නම් අපිත් උන්ව රවට්ටමු.

රටට අවශ්‍යයි ජාතික ව්‍යාපාරයක්; නව පුනරුද යුගයක්. කාන්තාවන් අයිතිවාසිකම් දීලා, කෘෂිකර්මාන්තයට පණ දීලා, අධ්‍යාපනය නගා සිටුවලා, සෞඛ්‍යය නගා සිටුවලා මේ රට නව පුනරුද යුගයකට අවතීරණ කළ යුතුයි. සංවර්ධනය තෙවදෑරුම් වෙනවා. භෞතික සංවර්ධනය හා අධ්‍යාත්මික සංවර්ධනය නගා සිටුවන්න ඕනෑ. ජාතික සමගිය, ආදරය, මෛත්‍රිය, කරුණාව, මනුස්සකම තිබෙන්නේ එතැන. තෘප්තිය, සාධාරණය තිබෙන්නේ එතැන. ඒක ගොඩනගන්න විනය හදන්න ඕනෑ. ඒකට හොඳ මාධ්‍ය තමයි, කලාව, අධ්‍යාපනය, ජන මාධ්‍යය. මේ සියල්ල පාවිච්චි කරලා මහා පුනරුද යුගයකට සූදානම් වෙන්න ඕනෑ. අපට විශාල කාර්යභාරයක් තිබෙනවා. අප ඉදිරියේ එන අනගි අවස්ථාව මඟහැර ගන්න එපා. ජාතික ජන බලවේගය සමග අත්වැල් බැඳ ගන්න කියා අපි ඉල්ලා සිටිනවා.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# සාදය හමාරවනු ඇත්තේ කෙසේද?

උඩු මහලේ පවතින සාදය හමාරවීමේ ලකුණු දැන් දැන් පහළ වෙමින් තිබේ.

මේ 'උඩු මහලේ සාදය' පොදු ජනතාවට අයත් එකක් නොවීය. 'උඩු මහලේ' සිටියේ ධන කුවේරයන්, චෞරයන් හා රදලයන්ය. ඔවුන්ගේ සාදය වෙනුවෙන් හැමදාම වෙහෙස වූයේ, දහඩිය කඳුළු වැගිර වූයේ, පීඩාවට පත්වූයේ, බර පැන දැරූයේ බිම් මහලේ සිටි පොදු ජනතාවය. වැඩකරන ගැහැනු හා මිනිසුන්ය.

ආරම්භයේදී මේ 'උඩු මහලේ සාදය' පිළිබඳ පොදු ජනයාට එතරම් අවබෝධයක් නොතිබුණා විය හැකිය. එහෙත් දැන් තත්වය වෙනස්ව තිබේ. පීඩාව විසින්, අත්දැකීම් විසින්, දැනුම විසින් පොදු ජනයා උඩු මහලේ සාදය තමන්ට බරක් බවත් එය වහාම හමාර කළ යුතු බවත් තේරුම් ගෙන සිටිති. සාදය නිමා කිරීමට පොදු ජනයා දැන් අදිටන් කරගෙන සිටිති. එය දූෂිතයින්, චෞරයන්, බිය වැද්දීමට සමත්ව සිටිති.

'සාදය' දිගටම පවත්වාගෙන යාමට මොවුන් උත්සාහ කරන අතර, පොදු ජනයා එය නිමා කිරීමේ දිනය එනතුරු දින ගනිමින් සිටිති. කෙසේ වෙතත් සාදය නිමාවන්නේ කෙසේද යන්න තීරණය වනු ඇත්තේ චෞරයන් හා ප්‍රභූන් ඒ පිළිබඳ ගන්නා ක්‍රියාමාර්ගය අනුවය.

ඉහත කරුණු දේශපාලනිකව තේරුම් ගන්නේ නම් ඒ මෙසේය. මේ වසරේ සැප්තැම්බර් මැද හා ඔක්තෝබර් මැද අතර දිනෙක මෙරට ජනාධිපතිවරණය පැවැත්විය යුතුව ඇත. එය කාගේවත් කැමැත්ත අකමැත්ත මත සිදුවන්නක් නොව ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සිදුවන්නකි.

මෙරට සිටින සියලු ජනයා, සියලු වාමවාදී, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී හා දේශප්‍රේමී බලවේග ඉදිරි ජනාධිපතිවරණය දෙස ඕනෑකමින් බලා සිටිති. ඒ මෙතෙක් පැවති ප්‍රතිගාමී, කොල්ලකාරී දූෂිත පාලනය නිමාකොට ජනතාවාදී පාලනයක් බිහි කිරීම සඳහාය.

එහෙත් බලය හොබවන ජනාධිපතිවරයා හා ඒ වටා පෙළගැසුණු චෞර වළල්ලේ සමහර ප්‍රකාශ, හැසිරීම් හා ඉඟි බිඟි කියා පාන්නේ එම ප්‍රජාතන්ත්‍රවාදී අවස්ථාව පොදු ජනතාවට ලබාදීමට ඔවුන් පැකිළෙන බවය. බලය අත් නොහැර සිටීම සඳහා, දූෂිත පාලක කණ්ඩායම තුළම බලය රඳවා ගැනීම සඳහා කුමන හෝ ගැටයක් ගැසීමට කුමන්ත්‍රණ කිරීමට ඔවුන් උත්සාහ කරන බවය. ජනාධිපතිවරණය නොපවත්වා ඉන් මගහැර යාමට ක්‍රම සෙවීම මගින් එය පෙනේ.

මේ පිළිබඳව ඉතාම කෙටියෙන් පැවසිය හැකි වන්නේ මෙයයි. රටක පාලනයක් වෙනස් කිරීමට එරට ජනතාව තීරණය කළ විට, පාලනයේ වෙනසක් වෙනුවෙන් සමස්ත ජනතාවක්ම අධිෂ්ඨානයෙන් පෙළගැසුණු විට එම ජනයාගේ කැමැත්ත කුමන්ත්‍රණවලින්, යටිකූට්ටු වැඩවලින්, ව්‍යවස්ථා විරෝධී පියවරයන්ගෙන්, පැරදවිය නොහැකි බව ලෝක ඉතිහාසය යළි යළිත් උගන්වා තිබෙන බවය. එලෙස උත්සාහ කළ ඒකාධිපතියන් සියලු දෙනාම අවසානයේ නතර වූයේ ඉතිහාසයේ කුණු බක්කිය තුළය.

දැන් රනිල් වික්‍රමසිංහ ඇතුළු පාලක නඩයම එකක් තේරුම් ගත යුතුය. ඒ රනිල්ලාගේ සාදය හමාර කිරීමට මෙරට පොදු ජනයා තීරණය කර අවසන් බවය. එය නැවැත්වීමට පැරණි උපක්‍රම දැන් වලංගු නැත. ඉඩම් ඔප්පු ලබාදීම(!) හාල් මලු බෙදාදීම්, විවිධ ඡන්ද අල්ලස් ලබාදීම් තවදුරටත් වලංගු නැත. මහ පොළොවේ යථාර්ථය එයයි.

අනෙක් අතට ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම්, ඡන්ද මගහැර යාමට උත්සාහ කිරීම්, බලය මාරුකිරීමට ජනයාට ඇති ප්‍රජාතන්ත්‍රවාදී අවස්ථාව ලබානොදී සිටීම හා බලහත්කාරයෙන් බලයේ රැඳී සිටීමට දරන උත්සාහයන් තවදුරටත් පොදු ජනතාව ඉවසන්නේ නැත. ඔවුන් සියලු දෙනාගේම අපේක්ෂාව ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ව්‍යවස්ථාවට අනුව මහජන ඡන්දයේ බලයෙන් පවතින දුෂ්ට පාලනය නිමා කිරීමත් තමන් කැමති පාලනයක් ගොඩනඟා ගැනීමත්ය.

එහෙත් රනිල් වික්‍රමසිංහ යම් හෙයකින් එම අවස්ථාව ජනතාවට ලබා නොදෙන්නේ නම්, ජනතාව තම පරමාධිපත්‍යයේ අයිතිය වෙනුවෙන් වීදි බසිනු ඇත. තමන්ම අලුත් පාලනයක් බිහිකර ගැනීමට බාධා පමුණුවන ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලකයන් එලවා දමනු ඇත.

එබැවින් රනිල් වික්‍රමසිංහලාට දැන් තෝරා ගැනීමට ඇත්තේ මාවත් දෙකක් පමණි. ඒ, එකක් ජනාධිපතිවරණය නියමිත ලෙස පවත්වා ජනතා තීන්දුව මත ජනාධිපති සිහසුනෙන් බැස යාමය. නැතිනම් ජනතා විරෝධයට ලක්ව බලය අතහැර පලායාමය. මේ දෙකෙන් වඩාත් ගෞරවණීය ආකාරය තෝරා ගැනීම පාලකයන්ට බාරය. කුමක් වුවත් මේ වසරේ ජනාධිපතිවරණය පැවැත්වීමට සිදුවන අතර, ජනතාව තමන්ගේම පාලනයක් බිහිකර ගනු ඇත.

# ජනතාව දේශපාලන වෙනසක් ඉල්ලා සිටිනවා



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික
**විජිත හේරත් සහෝදරයා**

> තැන් තැන්වල විවිධ වෙස්මුහුණු බැඳගෙන වෙන්ව සිටි කණ්ඩායම් දැන් එකගොඩකට එකට එකතු වෙනවා. කඳවුරු දෙකේ ද්වන්ධ දේශපාලන සටන තමයි මෙවර ජනාධිපතිවර සටන. අපි ඒ සටනට මුහුණ දෙන්න ලැහැස්තියි. අනිවාර්යයෙන්ම ඒ සටනෙන් ඉතිහාසයේ පළමුවෙනි වතාවට මේ රටේ ප්‍රගතිශීලී දේශමාමක ජනතාව මාලිමාව ජයග්‍රහණය කරවනවා.

***ජාතික ජන බලවේගය නියෝජනය කරමින් අනුර දිසානායක සහෝදරයා, ඔබ ඇතුළු පිරිසකට පළමු වරට ඉන්දියානු රජයෙන් නිල සංචාරයක් සඳහා ඇරයුම් ලැබුණා. මීට අදාළ පසුබිම සහ ප්‍රතිඵල ගැන කිවුවොත්?***

ඉන්දියානු ආණ්ඩුව මේ ආරාධනය කළේ හදිසියේ නොවෙයි. පසුගිය වසරේ දෙසැම්බර් මාසයේ නිල වශයෙන් මේ ආරාධනය කළත්, අපේ දේශපාලන කටයුතු අතර කාලසටහනක් හදා ගන්න යම් කාලයක් ගත වුණා. පෙබරවාරි මාසයේ මුල ගමනට සූදානම් බව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මගින් අප ඉන්දියානු ආණ්ඩුවට දැන්වූවා. ඇත්තෙන්ම අපට ලැබුණේ දින දහයක ආරාධනයක්. කාර්යබහුලකම නිසා අපේ පැත්තෙන් සංචාරය දින පහකට සීමා කළා. අපට දැනෙන විදිහට නිල ආරාධනාව කරන්න හේතුව ශ්‍රී ලංකාව තුළ වඩාත්ම ශක්තිමත් දේශපාලන ව්‍යාපාරය මාලිමාව වීමයි. ඊළඟ ආණ්ඩුව හදන කණ්ඩායම, ජනාධිපතිවරණය දිනන කණ්ඩායම මාලිමාව වීම නිසයි. ඉන්දියාව අපි සම්බන්ධයෙන් යම් මැනීමකට ඇවිත් තිබෙනවා. ඊළඟ රට පාලනය කරන කණ්ඩායමත් එක්ක රාජතාන්ත්‍රික සම්බන්ධතාවයක් හදා ගැනීමේ වුවමනාව ඔවුන්ට තිබෙනවා.

රට තුළ ජනතාවගේ තෝරාගැනීම බවට පත්වෙලා තියෙනවා වගේම ජාත්‍යන්තරය තුළත් අපව තේරුම් අරගෙන තිබෙනවා. අපට ජාත්‍යන්තර පිළිගැනීමක් ඇවිත් තිබෙනවා. ඒ නිසා රටවල් දෙක අතර රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට ජාතික ජන බලවේගය සහ ඉන්දියානු ආණ්ඩුව අතර කිට්ටු සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමත් අරමුණු කර ගෙන තමයි මේ ආරාධනාව අපට කළේ. මේ ගමන තුළ දේශපාලනික සහ ආර්ථික සම්බන්ධතාවන් ගොඩනගා ගැනීම පිළිබඳ ඉතාමත් වැදගත් හමුවීම් හා සාකච්ඡා ගණනාවක් සිදුවුණා. ඒ වගේම විශේෂයෙන් තොරතුරු තාක්ෂණ, කෘෂිකාර්මික සහ කාර්මික වැනි ක්ෂේත්‍රයන්ගෙන් රටට ගත හැකි ප්‍රයෝජන සම්බන්ධයෙන් අත්දැකීම් හුවමාරු කරගැනීමට හැකි වුණා.

පළමුවෙන්ම අපේ පක්ෂයේ නායක අනුර දිසානායක සහෝදරයා සහ ඉන්දියානු මධ්‍යම ආණ්ඩුවේ විදේශ අමාත්‍ය ජයශංකර් මහතා අතර පස්වැනිදා උදේ හමුවීමක් සිදුවුණා. එදිනම සවස ඉන්දියානු ජාතික ආරක්ෂක උපදේශක, අජිත් දොවාල් මහතා සමඟ සාකච්ඡා පවත්වා රාත්‍රියේදී ඉන්දියානු විදේශ ලේකම් විනයි මෝහන් මහත්මා සමඟ නිල සාකච්ඡාවක් සහ සුහද සාකච්ඡාවක් පැවැත්වූවා. පළමු දිනයේදී විදේශ අමාත්‍යවරයා, විදේශ ලේකම්වරයා සහ ජාතික ආරක්ෂක උපදේශකවරයා යන තිදෙනාම හමුවුණා.

ඒ වගේම ගුජරාට් ප්‍රාන්ත සංචාරයේදී එහි මහ ඇමැති භූපෙන්ද්‍රභායි පටෙල් මහතාත්, ඒ වාගේම එම ප්‍රාන්තයේ කර්මාන්ත අමාත්‍ය බල්රාජ් සිං රාජ්පුත් මහතාත් ප්‍රාන්ත විධාන සභාවේදී මුණගැසී දෙපාර්ශ්වය සාකච්ඡා කළා. පසුව කේරළ ප්‍රාන්ත සංචාරයේදී එහි කර්මාන්ත ඇමැති රාජීව් මහතා හමුවුණා. එහි ඉන්දියානු මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය බලය හොබවනවා. ඒ වගේම ඉන්දියානු මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් සීතාරාම් යෙචුරි මහතා හමුවීමටත් ලැබුණා.

අවසාන වශයෙන් අපි හිතනවා ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේදී කලාපීය අසල්වැසියා විදිහට ඉන්දියාවේ සහයෝගය අපට අත්‍යවශ්‍ය බව. ඒ වගේම කාලයට හා අවස්ථාවන්ට සාපේක්ෂව ඉන්දියාව වෙනස්කම් කරගෙන ඇති බවත් ඉන්දියාවේ සහයෝගය මාලිමාවේ පාලනයකට ලැබෙන බවත් තහවුරු වුණා. එය ස්ථිර වුණා.

***ඉන්දියානු සංචාරය හා සමගාමීව මෙරට දේශපාලන ක්ෂේත්‍රය තුළ විශාල කැළඹීමක් නිර්මාණය වුණා. මේ තත්වය ඔබ තේරුම් ගන්නේ කොහොමද?***

ඔව්, ඉන්දියානු ගමන ලංකාවේ දේශපාලනය තුළ කැලඹීමක් ඇති කළ බව රහසක් නෙමෙයි. විශේෂයෙන් අපේ ප්‍රතිවාදීන් හොඳටම කලබල වුණා. ඒගොල්ලන් හිතාගෙන සිටියේ අපිට රාජතාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාමට බැහැයි කියලයි. නමුත් තුන්දෙනෙක් ඉන්න අපිට ඉන්දියාව නිල ආරාධනාවක් කිරීමෙන්ම, මේ රටේ දේශපාලනය උඩු යටිකුරු වුණා. ඔවුන් මේ ගමන නිසා භීතියට පත් වුණා. ඉන්දියාවේ සහාය මාලිමාවට තිබෙනවාය කියන එක්ක ඔවුන් කලබල වුණා. රාජ්‍යතාන්ත්‍රික මට්ටමේ පිළිගැනීමක් ලැබීමම, ඔවුනට ඉවසාගෙන සිටීමට බැරි වුණා. ඒ තත්වය ඔවුන්ගේ විවේචන, වියරු ප්‍රකාශ මගිනුත් අවලාද, අපහාස මගිනුත් ප්‍රකාශයට පත් වුණා. ඉන්දියානු ගමන මගින් මාලිමාවට පිළිගැනීමක් ලැබුණ බව සතුරන් කලබල වීමෙන්ම පෙන්නුම් කළා. ඒක තමයි මේ තුළ සිදුවුණු දේ.

ඒ කලබලය විසින්ම තමයි, දේශපාලනය තුළ මහා කැළඹීමක් ඇති වුණේ. ඇත්තටම අපි ඒ ගැන සතුටු වෙනවා; ආඩම්බර වෙනවා. කලාපය තුළ රටක් විදිහට ඉස්සරහට යාමේදී ලෝක භූ දේශපාලනයේදී ගොදුරක් වෙන්නේ නැතිව භූ දේශපාලන තරගයට අසුවෙන්නේ නැතිව අපේ රටේ ස්වාධීනත්වය, ස්වෛරීත්වය ආරක්ෂා කර ගනිමින් මේ ඉන්දියාව සහ ලංකාව අතර ගොඩනැගෙන සම්බන්ධතාවය ලංකාවේ ජනතාවට වඩාත් වාසිදායක විදිහට පෙරළා ගන්න හැකියාවක් ලැබුණා. ජාතික ජන බලවේගය මේ රටේ ජනතාවත් සමඟ විශාල දේශපාලන ජයග්‍රහණ ලබා ගනිමින් සිටින අවස්ථාවක කලාපයේ අසල්වැසි ඉන්දියා රාජ්‍යයත් එක්ක කිට්ටු මිත්‍ර සම්බන්ධතා ගොඩනගා ගෙන තිබීම රටේ ජනතාවගේ යහපත සඳහා වැදගත් වෙනවා.

***2024 වසර ශ්‍රී ලංකාවේ දේශපාලනයේ අතිශය තීරණාත්මක වසරක්. ආණ්ඩුව තමන්ගේ පැවැත්ම කෙසේ හෝ දිගු කර ගැනීමේ අරමුණින් සහන මල්ලක් දිග හැරීමට පටන් ගෙන තිබෙනවා. මෙම යථාර්ථය ජනතාව තේරුම් ගනු ඇත්ද?***

මෙවර ජනාධිපතිවරණය අනිවාර්යයෙන් පවත්වන්න සිදුවෙනවා. ඒක වළක්වන්න බැහැ. ලබන සැප්තැම්බර් 17 ඔක්තෝබර් 17 අතර දිනෙක ජනාධිපතිවරණය පැවැත්වෙනවා. ඒ ජනාධිපතිවරණයේදී මාලිමාවේ ජයග්‍රහණය දැනටමත් රට පුරා තහවුරු වෙමින් යනවා. ආණ්ඩුව කලබල වෙලා තිබෙනවා, දැන් අස්වැසුම දීමනා වැඩි කරන්න, වැඩිහිටි දීමනා දෙන්න, ලක්ෂ ගණන් ගොවියන්ට ඉඩම් ඔප්පු දෙන්න තීරණය කරලා. අවුරුදු 76ක් පුරා කළ වගේ දැන් ආයෙත් උත්සාහ කරන්නේ ජනතාව රවටන්නයි. තව ඉදිරියට තව තව තාවකාලික සහන මලු ගොඩක් එන්න පුළුවන්. ලාබ ටකරං වගේ බාල පොරොන්දු වැහි වැහැලා.

හැබැයි මේවායින් ජනමතය ආපස්සට හරවන්න බැහැ.

දැන් රටේ

11 වැනි පිටුවට




# දේශපාලන මීයෝ..

රටක ජාතික සම්පත් යනු ඒ රටේ පැවැත්මයි. ඒ රටේ ජාතික ආරක්ෂාවයි. කන්තලේ සීනි, වාලච්චේන කඩදාසි, ඔරුවල වානේ, කැලණි ටයර්, පූගොඩ, තුල්හිරිය පෙහෙකම්හල්, කොස්ගම තුනීලෑලි, යාපනය, හලාවත සිමෙන්ති, මඩකළපුව උකුකිරි, ලක් පොහොර, සිලෝන් ටී ඉතිහාසයේ අපේ රටේ පැවැත්ම තහවුරු කළ ජාතික සම්පත්ය; මහජනයා සතු දේපළය. අපේ රටේ ආර්ථික ස්වාධීනත්වයේ පැවැත්මට මෙම ජාතික සම්පත් විසින් දෙන ලද දායකත්වය අතිමහත්ය. නමුත් අපේ රටේ දේශපාලන මීයෝ මෙම සම්පත් කාබාසිනියා කර දැමුවෝය.

පසුගියදා ශ්‍රීලංකන් ගුවන් සේවයට අයත් ගුවන් යානයක කාර්මික දෝෂයක් යැයි පවසමින් ගුවන් ගමන් කිහිපයක්ම අත්හිටුවීය. පසුව පැවසුවේ ගුවන් යානයට මීයෙකු රිංගා ඇති බවය. යානයට කෙසේ වෙතත් මීයා රිංගා ඇත්තේ ගුවන් සමාගමට බව අධ්‍යක්ෂක මණ්ඩල නිලධාරීන්ගේ කන්කෙඳිරිවලින් පසක් වෙයි. දැන් අපේ රටේ දේශපාලන මීයන් කෙළ හලන්නේ ගුවන් සේවයට බව නොරහසකි. ඒ අනුව ශ්‍රී ලංකන් ගුවන් සේවාව විකිණීම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවනු ලැබ ඇත. මෙම ටෙන්ඩර් කැඳවීම කරන මොහොතේදීත් ඊට සම්බන්ධ ග්‍රවුන්ඩ් හැන්ඩ්ලින්, කේටරින් හා කාගෝ සේවාවන් ලාභ ලබමින් ඇත; රටට ඩොලර් උපයමින් ඇත.

රටක ජාතික ගුවන් සේවාව ඒ රටේ ස්වාධීනත්වයට, රටේ ආර්ථිකයට කෙතරම් වටින්නේද යන්න තේරුම් ගැනීමට කුඩා දරුවෙකුට වුවත් හැකිය. නමුත් මෙම දේශපාලන මීයන්ට අවැසි වන්නේ ඉතිහාසයක් පුරාවට අපේ රටේ ජාතික සම්පත් කාබාසිනියා කර දැමුවා සේම, ජාතික ගුවන් සේවාවත් කීතු කර දැමීමටය. කුණු කොල්ලයට විකුණා දැමීම වෙනුවෙන් ගුවන් සමාගමේ මෙහෙයුම් පවා දැන් අක්‍රිය කිරීමට ඔවුහු උත්සහ දරමින් සිටිති.

මින් නොනවතින මෙම දේශපාලන මීයෝ, ජාතික ආරක්ෂාවට හා ආර්ථිකයට ඉතා වැදගත් ජාතික සන්නිවේදන සේවාව වන ශ්‍රී ලංකා ටෙලිකොම්, ඛනිජ තෙල් සංස්ථාව, විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය වැනි ලාභ ලැබිය හැකි ආයතනද පශු සම්පත් මණ්ඩලයට අයත් ඉඩම්ද කාබාසිනියා කර දැමීමට පිඹුරුපත් සකසමින් සිටිති. එම ආයතන "ලාභ නොලබන, මීයන් ලගින, වැඩකට නැති ආයතන" බවට ජනතාවට ඒත්තු ගැන්වීමට කටයුතු කෙරෙමින් ඇත.

වසර හැත්තෑ හයක් පැරණි පසුගාමී ලාංකේය ධනෙශ්වරය අපේ රට, රටේ ආර්ථිකය ඇදවැට්ටිය හැකි අසීරු අඩියටම ඇදවට්ටා ඇත. මෙම තත්වයෙන් ගොඩගැනීමට මෙම අදූරදර්ශී ධනපති පාලකයින්ටත්, ධනේශ්වර ආර්ථික සැලසුම්වලටත් "විකිණීම" හැර වෙනත් වැඩපිළිවෙළක් නොමැති බව රටේ ජාතික සම්පත් විකිණීමට සැලසුම් කිරීම තුළින්ද පසක් කෙරේ.

# දිනන සටනට පණ පොවා මිස...

බලන් දෙරණත
නැගෙන ජය ගොස
පිරෙන ගම්බිම්
සවිය අරගෙන...
සිහින දැරූ හිත්
පියවි ලොව හෙට
සැබෑ කරමින්
පැතුම් පොදි බැඳ...
රටක් ඇත අප
හැමගෙ අභිමුව
වෙනස් කෙරුමට
රටා තබමින...
ලොවක් ඇත අප
වෙළාගෙන හෙට
දිනන්නට මහ
සෙනඟ මැදිවුණ...
නොවේ හැරුමක්
ආපසුව අද
දිනන සටනට
පණ පොවා මිස...
උපන් මේ බිම
මටත් නුඹටත්
පුරා යුතුකම්
මියෙත් කම් නැත...



# රට පුරා තරුණ රැලි මාලාවක්



ජාතික ජනබලවේගයේ ජයග්‍රහණ අරමුණු කරගනිමින් සමාජවාදී තරුණ සංගමය විසින් රට පුරා දැවැන්ත තරුණ රැලි මාලාවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබේ.

මෙහි පළමු රැලිය මාතර නගරයේදී පැවැත්වීමට නියමිතය. මේ සඳහා විශාල තරුණ තරුණියන් ප්‍රමාණයක් සහභාගි කරවීමට මේ වන විට වැඩසහන් ආරම්භ කර ඇති අතර මෙම තරුණ රැලි මාලාව ලාංකේය ඉතිහාසයේ නවමු අත්දැකීමක් වනු ඇත.

# මිලක් නැති, හෙටක් ඇති ආදරය අලුත් කරමු!

සෑම වසරකම වැලන්ටයින් දිනය නිමිත්තෙන් සමාජවාදී තරුණ සංගමය විසින් විවිධ වැඩසටහන් පවත්වනු ලබයි. මෙවරද එම දිනය වෙනුවෙන් වැඩසටහන් කිහිපයක් නුවරඑළිය, හම්බන්තොට හා බලංගොඩ නගර ආශ්‍රිතව පවත්වනු ලැබීය. එහි ප්‍රධාන වැඩසටහන නුවරඑළිය නගරයේදී සංවිධානය කොට තිබුණි. තරුණ තරුණයින්ට මල්මිටක් හා තරුණ සංගමයේ පණිවිඩය සහිත බුක්මාර්ක් එකක් බෙදා දුන් අතර එහිදී ගීත රසවින්දන වැඩසටහනක් පැවැත්විණි.



# සමාජ මාධ්‍ය මර්දන පනත හකුළා ගනු!





ආණ්ඩුව විසින් ප්‍රජාතන්ත්‍රවාදය හකුළමින් ගෙන එන සමාජ මාධ්‍ය මර්දන පනත හා ත්‍රස්ත මර්දන පනතට එරෙහිව සමාජවාදී තරුණ සංගමය ඇතුළු තරුණ සංවිධාන හා තරුණ ක්‍රියාකාරීන් විසින් රට පුරා විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කර ඇත.

ඊට සමගාමීව "ඒකාධිපති වියරුවට සැරසෙන සමාජ මාධ්‍ය පනත වහා හකුළා ගනු" මැයෙන් මහරගම නගරයේදී පසුගිය පෙබරවාරි 17 දින විරෝධතාවයක්ද පවැත්විණි.




## ලොව විශාලතම පුස්තකාලය



චීනයේ, ටියැන්ජින්හි බින්හයි දිස්ත්‍රික්කයේ පිහිටා ඇති තට්ටු පහක පුස්තකාලය, ලන්දේසි මෝස්තර සමාගමක් වන එම්.වී.ආර්.ඩී.වී විසින් ටියැන්ජින් නාගරික සැලසුම් හා සැලසුම් ආයතනය (ටුපීඩී) සමඟ එක්ව සැලසුම් කරනු ලැබ ඇත. එය වර්ග මීටර් 33,700ක සංස්කෘතික මධ්‍යස්ථානයක් වන අතර එහි දීප්තිමත් ගෝලාකාර ශ්‍රවණාගාරයක් සහ බිම සිට සිවිලිම දක්වා පොත් රාක්ක කඳුරැල්ලක් ඇත. එහි පොත් මිලියන 1.2ක් දක්වා රඳවා ගත හැකිය. ඉදිකිරීම නිම කිරීමට වසර තුනක් පමණක් ගත වන අතර, පුස්තකාලයේ බිම් මහලේ කියවීමේ ස්ථානයක්, මැද කොටසේ හා කාර්යාලවල විවේකාගාර, රැස්වීම් අවකාශයන් සහ ඉහළ මාලයන්හි පරිගණක සහ ශ්‍රව්‍ය පහසුකම් සහිත කාමර ඇතුළත් වේ.

## යෝධ සර්ප විශේෂයක් ඇමේසන් හිදී සොයා ගැනේ



ඉ ක ' ව දෙ ා ' රි ය ා නු ඇමේසන්හි Baihuaeri Waorani ප්‍රදේශයේදී ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයේ මහාචාර්ය බ්‍රයන් ෆ්‍රයි ඇතුළු විද්‍යාඥයින් කණ්ඩායමක් කලින් ලේඛන ගත නොකළ ලොව විශාලතම ඇනකොන්ඩාවෙකු ඉක්වදෝරියානු ඇමසන් වනාන්තරයෙන් සොයා ගෙන තිබේ. ඒ, විල් ස්මිත් විසින් සත්කාරකත්වය දරන සංචාරක කණ්ඩායමක් විසින් වාර්තා චිත්‍රපටයක් සඳහා රූගත කිරීම් අතරතුරදීය. මෙම අලුතින් නම් කරන ලද උතුරු හරිත ඇනකොන්ඩාගේ (Eunectes Akayima) නිදර්ශක කිහිපයක් අල්ලාගෙන අධ්‍යයනය කර ඇති බවද වාර්තා වේ.

## ලංකාවේ පළමු වරට නිපද වූ ඩ්‍රෝන පොහොර නිෂ්පාදනය




ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ජලජ සම්පත් තාක්ෂණ උපාධි පාඨමාලාව සහ Agri Farm Elovators ආයතනය හා එක්ව ලංකාවේ පළමුවරට ඩ්‍රෝන විශේෂිත දියර පොහොර නිෂ්පාදනය කිරීමට සමත්වී ඇත. Natural Bio Polymer තාක්ෂණය ඔස්සේ මෙම ඩ්‍රෝන විශේෂිත දියර පොහොර නිෂ්පාදනය කර තිබේ.

යූරියාවල පවතින නයිට්‍රජන් පියවර ගණනාවක් ඔස්සේ නයිට්‍රේට් බවට පත්කර ශාකයට පහසුවෙන් අවශෝෂණය කළ හැකි පරිදි නිපද වූ ශ්‍රී ලංකාවේ පළමු ඩ්‍රෝන විශේෂිත දියර පොහොර මෙය වේ.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නුවන් ලියනගේ සහ මනෝරි බඹරැන්ද, අධ්‍යක්ෂක රුවන් සේනාරච්චි, පර්යේෂක දුලිත් සංදීප සේනාරත්න, අමාලි නවංජනා විරිදුගේ සහ තුසිත දිල්රුවන් යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත පර්යේෂක කණ්ඩායම විසින් මෙම සොයා ගැනීම සිදු කර තිබේ.

# නව නිදහස් අරගලයක් ඇයි?



මේ වන විට ලාංකේය දේශපාලනය නව පරිවර්තන යුගයකට අවතීර්ණ වී තිබේ. මෙරට පොදු ජනයා මෙතෙක් කල් තෝරාගත් සාම්ප්‍රදායික, පැරණි දේශපාලන මාවත ප්‍රතික්ෂේප කරමින් නව සමාජ ආර්ථික පරිවර්තනයක් වෙනුවෙන් මාලිමාව වටා අධිෂ්ඨානයෙන් එක රොක් වෙමින් සිටී. එබැවින් ඉදිරි මාස කිහිපය තුළ මෙරට පැවති සාම්ප්‍රදායික දූෂිත ප්‍රභූ පාලනය වෙනස් කර, මහජන පාලනයක් බිහිවීමේ පෙරනිමිති පහළ වී තිබේ.

මේ නිසාම රට පාලනය කළ සකලවිධ ජනතා සතුරෝ කලබලයට පත්ව හිස ලූ ලූ අත දුවමින් විවිධ සන්ධාන, හවුල් අටවමින්, ජ.වි.පෙ.ට, මාලිමාවට මඩ අවලාද නගමින් විකාරරූපී රංගනයකද යෙදී සිටිති.

වර්තමාන දේශපාලනය නව මහජන ව්‍යාපාරයක් වෙත විශාල අභියෝග ගණනාවක් මතුකර තිබේ. හෙට දවසේ ජනතාවගේ ශක්තියෙන් ගොඩනැගෙන ජනතා පාලනය ඉදිරියේ ඇති අභියෝග හරියටම හඳුනා ගැනීම එම පාලනය, ජයග්‍රහණයන් ඔස්සේ යාම සඳහා වැදගත් වේ.

මේ වන විට ලංකාවේ පවතින ආර්ථික අර්බුදය සරල ආර්ථික අර්බුදයක් නොවේ. මීට පෙර පැවති මැතිවරණවලදී මෙන් සරල ආර්ථික සටන් පාඨවලට යටකළ නොහැකි අර්බුදයක් රට ඉදිරියේ තිබේ. 'හඳෙන් හාල්', 'ඇට රාත්තල් අට', '3.50ට පාන්', 'නොමිලේ පොහොර' වැනි සටන් පාඨ වත්මන් අර්බුදය තුළ තවදුරටත් වලංගු නැත. මේ වන විට ලංකාවේ ආර්ථිකය මුළුමනින්ම බිඳදමා රට ආර්ථික වශයෙන් බංකොලොත් කර බංකොලොත් බව නිල වශයෙන් ප්‍රකාශ කරද තිබේ. රටේ නිෂ්පාදන මාර්ග දුර්වල කිරීමේ, නිෂ්පාදන මාර්ග වසා දැමීමේ හා තිබෙන නිෂ්පාදන මාර්ග ඵලදායී නොවීමේ ප්‍රතිඵලය වී ඇත්තේ රට කරගෙන යාමට අවශ්‍ය අවම වත්කම හෝ උපයා ගැනීමට සමත් ආර්ථිකයක් රටට අහිමි වීමය.

පසුගිය දශක 04ක පමණ කාලය තුළ වත්කම් නොමැති වීමේ ගැටලුවට පාලකයන් විසඳුම් සෙවූයේ මහා පරිමාණයෙන් ණය ගැනීම තුළිනි. එහි ප්‍රතිඵලය වී තිබෙන්නේ මේ වන විට ගෙවා ගත නොහැකි තරමේ ණය කන්දකට රට යටවීමය. ණය ගෙවා ගැනීමට නොහැකිව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පැතීමට පවා සිදුවූයේ ණය කන්දේ විශාලත්වය වැඩි නිසාය. ණය මත යැපීමේ තත්වය තවමත් වෙනස්වී නැත. ආණ්ඩුව මේ වසර තුළදීද රුපියල් බිලියන 7350ක ණයක් ගැනීමට අපේක්ෂා කිරීමෙන්ම එහි බරපතළකම පෙනේ.

මේ අනුව එක් අතකින් දැන් ලංකාවට ආර්ථිකයක් නැත. එබැවින් හෙට දවසේ ගොඩනඟන මහජන පාලනයක අභියෝගය වන්නේ වට්ටවන ලද ආර්ථිකය යළි ගොඩගැනීමය. ශක්තිමත්, ස්ථාවර ආර්ථිකයක් නිර්මාණය කිරීමත් එහි ආර්ථිකයේ ප්‍රතිලාභ සියලු ජනයාට සාධාරණව බෙදී යන ක්‍රමයක් සැකසීමත් අප ඉදිරියේ ඇති අභියෝගය වේ.

අනෙක් අතට ලංකාව ආර්ථික වශයෙන් පරාධීනය. ලංකාවේ ආර්ථික ස්වාධීනත්වය නැත. මේ මොහොතේ ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය තීරණය කරන්නේ රනිල්-රාජපක්ෂ පාලනය නොව මූල්‍ය අරමුදලය. අනෙක් අතට ආර්ථිකයක් ගොඩගැනීමට අත්‍යවශ්‍ය සම්පත් විදේශ සමාගම් සතු කර තිබේ. ලංකාවේ වරායවල්, තෙල් බෙදා හැරීම, සමහර ස්වභාවික සම්පත් විදේශ සමාගම්වලට පවරා තිබේ. ඉන් නොනැවතී ටෙලිකොම්, විදුලි බල මණ්ඩලය විකිණීමටද උත්සාහ දරමින් තිබේ. ලංකාවේ කිරි ගොවිපළ පවා විදේශ සමාග මකට බදු දීමට සූදානම්ය.

එසේම ලංකාව ලෝකය හමුවේ ණය ගැති රටක් බවට පත්කර තිබේ. ණය නිසා රටවලට ගැතිවී සිටීමට එම තත්වය ලංකාවට බලකර තිබේ. පාලකයන්ද ණය වෙනුවෙන් බලවත් රටවල් හමුවේ සිය ගැතිභාවය පෙන්වා තිබේ.

මේ සියල්ලෙන් පෙන්නුම් කරන්නේ ලංකාවේ ආර්ථිකයත් දේශපාලනයත් පරාධීන බවය. ඒ නිසාම ශක්තිමත් ස්ථාවර (නිෂ්පාදනය මත පදනම් වූ) ආර්ථිකයක් ගොඩනඟන අතර ආර්ථිකයේ ස්වාධීනත්වය දිනාගත යුතුව තිබේ. ලංකාව ආර්ථික, දේශපාලන පරාධීනත්වයෙන් මුදා ගත යුතුව තිබේ. ලංකාවේ තවමත් පවතින නව යටත්විජිතවාදී ආර්ථික, දේශපාලන ගමන තුළ ණය අර්බුදය හා ආර්ථික බංකොලොත්භාවය විසින් නිර්මාණය කරන ලද තත්වයන්ද සැලකිල්ලට ගත් විට දැන් අපේ රටට නව නිදහස් අරගලයක වුවමනාව මතුව තිබේ.

ඒ, ශක්තිමත් ස්ථාවර ආර්ථිකය සමග ආර්ථිකයේ ස්වාධීනත්වයද දිනාගත යුතු නිසාය; ආර්ථික, දේශපාලන පරාධීනත්වය පරාජය කොට ලංකාව ලෝකය ඉදිරියේ දෙපයින් සිට විය යුතු නිසාය. ඒ සඳහා කරන අරගලය නව නිදහස් අරගලයක ලක්ෂණ පෙන්වීම ස්වභාවිකය.

එසේම මේ වන විට අපේ රටේ සමාජයද බරපතළ පිරිහීමකට ලකිව තිබේ. වංචා, දූෂණ, හොරකම දේශපාලනයේ සංස්කෘතිය බවට පත්ව තිබේ. මහජන සේවා බිඳවැටී තිබේ. නීතියේ විධානය හා ආධිපත්‍යය නැති සාධාරණත්වය නැති විනයක් නැති රටක් බවට ලංකාව පත්කර තිබේ. සාමූහිකත්වය වෙනුවට ආත්මාර්ථය රජවී තිබේ. මානව ගුණධර්ම බිඳවැටී තිබේ. එය මෙතෙක් පවත්වාගෙන ආ කොල්ලකාරී, ඊනියා විවෘත ආර්ථිකයේම අතුරු ඵල බව පැහැදිලිය. ඒ නිසාම දැන් සමාජය තුළද බරපතළ වෙනසක්, පරිවර්තනයක් කළ යුතුව තිබේ. සාමූහිකත්වය, ආදරය මනුෂ්‍යත්වය පිරුණු, වංචා දූෂණ නැති, විනයගරුක සමාජයක් නිර්මාණය කිරීමේ අභියෝගය අප ඉදිරියේ තිබේ. අලුතින් සිතන මිනිසෙක් නිර්මාණය කළ යුතුය. ඒ සඳහා ජාතික පිබිදීමක්, ජාතික පුනර්ජීවනයක් අවශ්‍යය. ඒ නිසාම අලුතින් ගොඩනඟන මහජන පාලනයට, නව නිදහස් අරගලයක කාර්යභාරය සේම ජාතික පුනරුද ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වීමේ අභියෝගයද පැවරේ.

අනෙක් අතට නිදහසින් පසු වසර 76ක් තිස්සේ ගොඩනැගීමට අසමත් වූ ජාතික ඒකාග්‍රතාවය, ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමේ අභියෝග යද මහජන ව්‍යාපාරය ඉදිරියේ තිබේ. මාලිමාව ජනතා බලවේග පෙළගැස්විය යුතු වන්නේ ඉහත දැවැන්ත අභියෝග ජය ගැනීමට අවශ්‍ය දැනුම, හැකියාව හා කැපවීම සහිතවය. ඒ අනුව මෙම වසරේ සමාජය තුළ ගැඹුරු, පුළුල් පරිවර්තනයකට මාවත විවර කරන වසරක් වන බව ඉතා පැහැදිලිය. වසර 76ක දූෂිත, ප්‍රභූ පවුල් පාලනය නිමා කිරීම පහසු වුවත් ඉන්පසු ගොඩනඟන පාලනය හමුවේ වන අභියෝග සුළුපටු වන්නේ නැත. එබැවින් ජාතික ජන බලවේගයත් එය සමග අත්වැල් බැඳගත් සියලු බලවේගයන්ගේ හා පොදු ජනතාවගේත් වගකීම වන්නේ තමන් ඉදිරිපිට ඇති සැබෑ අභියෝගයන් තමන් වෙත පැවරෙන කාර්යභාරයන් නිවැරදිවම හඳුනා ගැනීමය. ඒ අනුව අප ඉදිරියේ ඇති අභියෝගය වන්නේ ශක්තිමත්, ස්ථාවර ආර්ථියක් ගොඩනගමින් ආර්ථික ස්වාධීනත්වය ඇති කිරීමත් ඊට ගැලපෙන ලෙස සමාජය තුළ ගැඹුරු පරිවර්තනයන් ඇති කරමින් නව සමාජයක් නව මිනිසෙක් ගොඩනැගීමය. ඒ නිසාම මෙය නව ජාතික නිදහස් අරගලයක, ජාතික පුනරුදයක ස්වරූපය ගනු ඇත.

**එක් අතකින් දැන් ලංකාවට ආර්ථිකයක් නැත. එබැවින් හෙට දවසේ ගොඩනඟන මහජන පාලනයක අභියෝගය වන්නේ වට්ටවන ලද ආර්ථිකය යළි ගොඩගැනීමය. ශක්තිමත්, ස්ථාවර ආර්ථිකයක් නිර්මාණය කිරීමත් එහි ආර්ථිකයේ ප්‍රතිලාභ සියලු ජනයාට සාධාරණව බෙදී යන ක්‍රමයක් සැකසීමත් අප ඉදිරියේ ඇති අභියෝගය වේ.**



"සතුරා අපට වියරු ලෙස පහර දෙන්නේ නම්ද, එකම එක යහ ගුණයක් හෝ නැතිව, හොඳටම කළු කොට අප සිත්තම් කරන්නේ නම්ද, එය වඩාත් හොඳය. අප සතුරාත් අපත් අතර පැහැදිලි වෙන්කිරීමේ ඉරක් ඇඳ තිබෙන බව පමණක් නොව, අප අපේ වැඩවලදී බොහෝ දේ මුදුන්පත් කර තිබෙන බවද එයින් පෙනී යයි."

**මාඕ සේතුං**

**තෝරාගත් ලිපි, 143 පිටුව**

# ගෝලීය අර්බුද සමග සමග ගැටගැසුණු යුරෝපයේ ගොවි විරෝධතා




යුරෝපා රටවල් දෙකක ගොවීහු යළිත් වරක් යුරෝපා සංගමයේ පාරිසරික ආරක්ෂණ ප්‍රතිපත්තිවලට එරෙහිව සහ කෘෂිකර්මාන්තය වෙනුවෙන් සහන ලබා දෙන ලෙස තම ආණ්ඩුවලට බල කරමින් පෙබරවාරි 15 බ්‍රහස්පතින්දා උද්ඝෝෂණ ව්‍යාපාරයක් ආරම්භ කළහ. මෙලෙස අලුතින් විරෝධතාවලට එක් වූයේ ඉතාලියේ සහ මෝල්ටාවේ ගොවීන්ය. මීට පෙර ජර්මනිය, ප්‍රංශය, බෙල්ජියම, නෙදර්ලන්තය, පෝලන්තය, බල්ගේරියාව, ග්‍රීසිය හා රුමේනියාව යන රටවල ගොවීහු මේ ආකාරයේම විරෝධතාවලට එක්වී සිටියහ. ඒ, ට්‍රැක්ටර් වැනි කෘෂිකාර්මික රථ දහස් ගණනක් රැගෙන ඒ ඒ රටවල ප්‍රධාන නගරවල මාර්ග අවහිර කරමින් විරෝධතාවෙහි යෙදෙමිනි.

මේ සෑම රටකම ගොවීන්ගේ ඉල්ලීම් බොහෝ දුරට සමාන විය. ඔවුන්ගේ අස්වනු සඳහා ප්‍රමාණවත් මිලක් නොලැබීම, නිෂ්පාදන වියදම් ඉහළ යාම, යුරෝපීය නොවන රටවලින් ආනයනය කෙරෙන නිෂ්පාදනවල අඩු මිල ගණන් සමග තරග කිරීමේ අපහසුතාවය සහ යුරෝපා සංගමය විසින් හඳුන්වා දී ඇති පාරිසරික ආරක්ෂණ ප්‍රතිපත්තීන් මෙම විරෝධතා වලට බලපා තිබුණි.

## නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම

විශේෂයෙන්ම 2022 පෙබරවාරි මාසයේදී රුසියාව යුක්‍රේනය ආක්‍රමණය කිරීමෙන් පසු බොහෝ යුරෝපා සංගම් රටවල ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් තිබේ. බලශක්තිය, පොහොර හා ප්‍රවාහන වියදම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් ඊට හේතු වී තිබේ. ඒ අතරම පාරිභෝගිකයන්ගේ ජීවන වියදම පහළ දැමීම සඳහා රජය සහ සිල්ලර වෙළෙන්දන් ආහාර මිල ගණන් පහත දැමීම විසින් ගොවීන් තවදුරටත් දුෂ්කරතාවට මුහුණ පෑවේය. 2022 වසරට සාපේක්ෂව 2023 වසරේදී කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා තොග මිල ගණන් සියයට නමයකින් (9%) අඩුවී තිබේ.

රුසියාව යුක්‍රේනය ආක්‍රමණය කිරිමත් සමඟ යුක්‍රේන කෘෂි නිෂ්පාදන සඳහා තීරු බදු සහන හා වැඩි කෝටා ප්‍රමාණයක් ලබා දීමත් ඊට අමතරව මධ්‍යම හා නැගෙනහිර යුරෝපා රටවලින් අඩු මිල කෘෂිකාර්මික නිෂ්පාදන ආනයනයත් හේතුවෙන් තරගකාරීත්වයේදී යුරෝපා සංගමයේ රටවල ගොවීන්ට බරපතළ අසාධාරණයක් සිදුවී ඇතැයි පැවසේ. එසේම ප්‍රංශය වැනි රටවලට නවසීලන්තය හා චිලිය වැනි රටවලින් ආනයනය කරන අඩු මිල කෘෂි නිෂ්පාදන විසින්ද තරගය තීව්‍ර කරනු ලැබ තිබේ. ප්‍රංශ ගොවීන් පවසන්නේ එම රටවල ගොවීන්ට පනවා ඇති පාරිසරික සීමා කිරීම් අඩු බැවින් ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන පිරිවැය අඩු බවයි. යුරෝපා සංගමය සහ දකුණු ඇමරිකාවේ Mercosur සංවිධානය අතර ඇති කරගත් පුළුල් වෙළඳ ගිවිසුමද ගොවීන්ගේ විරෝධයට හේතුවක් වී ඇත. මෙම ගිවිසුම ක්‍රියාත්මක වීමේදී යුරෝපය වෙත අඩු මිල සීනි, ධාන්‍ය හා මස් පැමිණෙනු ඇති අතර එමගින්ද තමන්ට බරපතළ අවාසි සහගත තරගයක් ඇති කරනු ඇති බව ඔවුන්ගේ අදහසයි.

## කාලගුණික විපර්යාස මගින් ඇති කෙරෙන බලපෑම්

මේ අතර කාලගුණික විපර්යාසයන්ද යුරෝපා කෘෂිකර්මාන්තයට දැඩි ලෙස බලපා තිබේ. දකුණු ස්පාඤ්ඤයේ සමහර ජලාශවල ජල ධාරිතාව 4%ක් දක්වා පහත ඇති බැස ඇති අතර ලැව් ගිනි හේතුවෙන් 2023 වසරේදී ග්‍රීසියේ ගොවිපළ ආදායමෙන් 20%ක් පමණ විනාශ වී ගොස් ඇත. ස්පාඤ්ඤයේ සහ පෘතුගාලයේ කලක් තිස්සේ පවතින නියඟය නිසා ඉදිරියේදී එම රටවල ආණ්ඩු ජල පරිභෝජනය සඳහා සීමා ඇති කිරීමට ඉඩ ඇති අතර එසේ වුවොත් මෙම තත්ත්වය තවත් උග්‍ර වනු ඇතැයි ගොවීහු පවසති.

## යුරෝපා සංගමයේ පාරිසරික නීති

මීට අමතරව යුරෝපීය ගොවීන් ප්‍රකාශ කරන්නේ ජනතාව මිල අඩු ආහාර නිෂ්පාදනයන් ඉල්ලා සිටින අතර යුරෝපා සංගමය පාරිසරික නීති දැඩි කරමින් තමන්ට මිල අඩු ආහාර නිපදවීමට බාධා පමුණුවන බවයි. මේ හේතුවෙන් යුරෝපා සංගමය තුළ කුඩා පරිමාණ ගොවිපළවල් විනාශ වී මහා පරිමාණ ගොවිපළවල් පමණක් ඉතිරි වන තත්වයක් ඇති වී තිබේ. 2005 වසරේ සිට සලකා බැලූ විට මේ වන විට යුරෝපා සංගමයේ කුඩා ගොවිපළවල් ගණන තුනෙන් එකකින් අඩුවී තිබේ.

යුරෝපා සංගමයේ හරිතාගාර වායු විමෝචනයෙන් 11% ක් සිදුවන්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය මගිනි. එය පාලනය කිරීම සඳහා යුරෝපා සංගමය හඳුන්වා දී ඇති පාරිසරික නීතිද බරපතළ ලෙස යුරෝපයේ කෘෂිකාර්මික නිෂ්පාදනවල පිරිවැය ඉහළ දැමීමට හේතු වී තිබේ. යුරෝපා සංගමයේ පාරිසරික යෝජනා අනුව 2030 වසර වන විට කෘමිනාශක භාවිතය 50% කින් අඩු කළ යුතු අතර පොහොර භාවිතය 20%කින් අඩු කළ යුතුය. කෘෂිකාර්මික ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් කෘෂි කාර්මික නොවන වගාවන් සඳහා වෙන් කිරීම හෝ පුරන්වීමට හැරීම කළ යුතුය. යුරෝපා සංගමය තුළ ඇති ගොවි බිම්වලින් 25%ක කාබනික කෘෂි වගා නිෂ්පාදනය දෙගුණ කළ යුතුය. මීට අමතරව වාරිමාර්ග ක්ෂේත්‍රයේ හා සත්ව සුභසාධනයට අදාළ යුරෝපා සංගමයේ නීති හේතුවෙන් ගොවීහු තවදුරටත් පීඩාවට පත්ව සිටිති.

## යුරෝපා ආණ්ඩු පසු බසී

යුරෝපයේ ගොවීන්ගේ මෙම විරෝධතාවන් කොතරම් ප්‍රබල වීද යත් ඒ ඒ රටවල ආණ්ඩුවලටත් යුරෝපා සංගමයටත් ඊට විසඳුම් නොදී සිටීමට නොහැකි විය. ඒ අනුව ජර්මනිය තමන් යෝජනා කර තිබූ ඩීසල් සඳහා ලබාදී ඇති සහන කප්පාදුව නවතා දැම්මේය. ප්‍රංශය ඩීසල් සඳහා යෝජනා කර තිබූ බදු ඉහළ දැමීම නවතා දැමීය. අනෙකුත් සහන කප්පාදු ටික කලකට කල් දමනු ලැබ තිබේ. අමතර යුරෝ මිලියන 150ක් කෘෂි කාර්මික සුභසාධනය සඳහා යෙදවීමට ප්‍රංශ ආණ්ඩුව තීරණය කර තිබේ.

යුරෝපා සංගමය යුක්‍රේනයේ කෘෂිකාර්මික නිෂ්පාදන ආනයනය වහාම සීමා කිරීමට තීරණය කළ අතර ගොවි බිම්වලින් 4%ක් පුරන් බිම් ලෙස නොතැබුවද 2024 වසරේ ගොවීන් සඳහා වෙන්කර ඇති සහනාධාර දිගටම ලබාදීමට තීරණය කර තිබේ.

එසේම ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මැක්‍රෝන් සහ අයර්ලන්ත ජනාධිපති ලියෝ වැරඩ්කා ප්‍රකාශ කළේ යුරෝපා සංගමය හා දකුණු ඇමරිකාවේ Mercosur අතර වෙළෙඳ ගිවිසුම අත්සන් කිරීම යළි සලකා බලන බවය.

කෙසේ වෙතත් ඇතැමුන් මත පළ කරමින් ප්‍රකාශ කර සිටින්නේ යුරෝපා සංගමයේ ආණ්ඩු මෙම පසු බැසීම සිදුකර ඇත්තේ එසේ නොකළහොත් ඉදිරියේ එන මැතිවරණයේදී එය තමන්ට අවාසිදායක ලෙස බලපාන බැවින්ය. එසේම එය තාවකාලික ක්‍රියා මාර්ගයක් වනු ඇති බවත් ඔවුහු පවසති.

යුරෝපා සංගමය හා එක් එක් රටවල ආණ්ඩු තම සහන කප්පාදු ක්‍රියාමාර්ග තාවකාලිකව ආපසු ඇද ගත්තද මතුවී ඇති කෘෂිකාර්මික අර්බුදයට එය දීර්ඝ කාලීන පිළියමක් නොවනු ඇත.

# බ්‍රිතාන්‍යය: අසාන්ජේගේ ඉරණම තීරණය කරන නඩුව අරඹා




දැනට බ්‍රිතාන්‍යයේ සිරගතව සිටින විකිලීක්ස් නිර්මාතෘ ජූලියන් අසාන්ජේ එක්සත් ජනපදයට පිටුවහල් කළ යුතුද නැද්ද යන්න තීරණය කරන නඩු විභාගය පෙබරවාරි 20වැනි දින ආරම්භ විය. එම නඩු විභාගය ලන්ඩනයේ මහාධිකරණය තුළ විනිසුරුකරුවන් දෙදෙනකුගේ සහභාගිත්වයෙන් ආරම්භ විය. මෙම කරුණ සම්බන්ධයෙන් පැවැත්වෙන අවසාන නඩු විභාගය බොහෝ දුරට මෙය විය හැකිය.

ජූලියන් අසාන්ජේ ගේ නීතිඥවරු ඔහු වෙනුවෙන් කරුණු දක්වමින් ඔහු මාධ්‍යවේදියකු මිස ඔත්තුකරුවකු නොවන බවත් ඔහු එක්සත් ජනපදයට පිටුවහල් කිරීමට ඉදිරිපත් කර ඇති හේතුව දේශපාලනික හේතුවක් බවත් ඔහුට අපරාධයකින් තොරව දඬුවම් ලබා දී ඇති බවත් එය මානව හිමිකම් පිළිබඳ යුරෝපා සම්මුතිය කඩකිරීමක් බවත් ලබා දී ඇති දඬුවම වරදට සාපේක්ෂව අසාධාරණ බවත් විදේශිකයකු පිළිබඳව බ්‍රිතාන්‍ය තුළදී නඩු විභාග කිරීම අසාධාරණ බවත් පැවසූහ.

# පලස්තීනය: මාධ්‍යවේදීන්ට මරණයේ භූමියක් වී




මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීම සඳහා වන කමිටුව නම් සංවිධානයට අනුව 2023 වසරේදී මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන සේවකයින් 99 දෙනෙකු ඝාතනය කරනු ලැබ තිබේ. ඒ අනුව 2015 වසරෙන් පසු එක් වර්ෂයකදී වැඩිම මාධ්‍යවේදීන් ප්‍රමාණයක් ඝාතනය කර ඇත්තේ මෙම වසරේදීය. එය පසුගිය වසරට වඩා 44%ක වැඩිවීමකි.

ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන් අතරින් 78 දෙනකු ඝාතනය කෙරී ඇත්තේ ඊශ්‍රායලය විසින් ගාසා තීරයේදීය.

# ඊශ්‍රායලය: යුද්ධය රටේ ආර්ථිකය කා දමමින්



ඊශ්‍රායලය විසින් ගාසා තීරය තුළ සිදුකරමින් පවතින යුද්ධය හේතුවෙන් ඊශ්‍රායල ආර්ථිකය ඉතිහාසයේ බරපතළම කඩා වැටීමකට ගොදුරු වී ඇතැයි එරට මධ්‍යම සංඛ්‍යාලේඛන කාර්යාංශය වාර්තා කර තිබේ. ඒ අනුව 2023 වසරේ අවසාන මාස තුනේ දී එරට දළ ජාතික නිෂ්පාදිතය 19.4%කින් හැකිළී තිබේ.

ආර්ථික විද්‍යාඥයන්ට අනුව යුද්ධය ඊශ්‍රායලයේ ව්‍යාපාරයන් අඩපණ කර ඇති අතර ශ්‍රම බලකාය දළ වශයෙන් 8%කින් අඩු කරනු ලැබ තිබේ. එරට ආයෝජනයන් 70%කට වඩා අඩුවී ඇති අතර පුද්ගල පරිභෝජනය සියයට 27කින් කඩා වැටී තිබේ.

2022 වසරේ ඊශ්‍රායලයේ ආර්ථික 6.5%කින් වර්ධනය වුවද 2023 වසරේ දී එය 2% දක්වා අඩුවී තිබේ.

# යේමනය: හුති කැලිකරුවන් නාවුක ගමනාගමනයට බාධා කොට



ඊශ්‍රායලයේ ගාසා තීරය ආක්‍රමණය කිරීමට එරෙහිව රතු මුහුදේ නාවුක යාත්‍රාවලට හුති කැරලිකරුවන් පහරදීම හේතුවෙන් උද්ගතවී ඇති අර්බුදය නිසා ආසියාවේ සිට යුරෝපය දක්වා භාණ්ඩ ප්‍රවාහන වියදම් 400%කින් ඉහළ ගොස් ඇති බවත් ගමනාගමන කාලය දින පහළොවකින් පමණ වැඩි වී ඇති බවත් යුරෝපීය ආර්ථික කොමිසම වාර්තා කර තිබේ.

මේ අතර ඩෙන්මාර්කයේ ප්‍රධාන නාවුක සමාගමක් වන AP Moller-Maersk සමාගම සිය පාරිභෝගිකයන්ට අනතුරු අඟවා ඇත්තේ රතු මුහුදේ අර්බුදය මේ වසරේ දෙවන භාගය දක්වා පවතිනු ඇති බවයි. ආසියාවේ සිට යුරෝපය දක්වා සුවස් ඇල හරහා කෙරුණු නාවුක ගමනාගමනය ලෝකයේ වාණිජ නාවුක ගමනාගමනයෙන් 15% ක් පමණ වේ.

# රනිල්ගේ පාර්ලිමේන්තු පැත්ත සහ ජනතාවගේ යථාර්ථයේ පැත්ත

රනිල් රාජපක්ෂ හවුල් පාර්ලිමේන්තු වාරයේ (නව වැනි පාර්ලිමේන්තුවේ) පස් වැනි සැසිවාරය විවෘත කරමින් රනිල් වික්‍රමසිංහ තවත් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් පසුගිය පෙබරවාරි 07වැනිදා පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කළේය. එම ප්‍රතිපත්ති ප්‍රකාශනය තනි වාක්‍යයකට ගොනු කළහොත් හරය වූයේ "මම විතරයි. මමයි රජා" යන්න පමණි. ඔහුට තවත් වතාවක් හදිස්සියේ පාර්ලිමේන්තු සැසිවාරය කල් තබා යළි කැඳවීමට තිබූ එකම හේතුව තමන් කවුදැයි තමන් බලයට ගෙනා පොදුජන පෙරමුණු රාජපක්ෂ කල්ලියට සහ කලින් බලයේ සිටි එජාප කණ්ඩායමට හැඟවීම හැර අන් වැදගත් යමක් එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නොවීය.

විටෙක ජනාධිපති රනිල් තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජනතා විමුක්ති පෙරමුණ ගැන සඳහන් කරමින්, රාජපක්ෂ සමයේ සිදුවූ දූෂණ සහ විමර්ශනයට පත්කළ දූෂණ විරෝධී කාර්යාලයේ ලිපිගොනු පිටපත් තවමත් අනුර දිසානායක ළඟ ඇති බව සඳහන් කරයි. එය ආණ්ඩුව හා ප්‍රතිපත්ති ප්‍රකාශනයකට කිසිසේත්ම අදාළ කරුණක් නොවේ. නමුත් ඔහු එම සඳහන් කිරීමෙන් වෙනත් පණිවුඩයක් ලබා දෙයි. ඒ, පාර්ලිමේන්තුවේ ඉන්නා රාජපක්ෂ කඳවුරේ හොරුන්ටය. අනුර දිසානායක බලයට පත් වුවහොත් උඹලාට දඬුවම් ලැබෙන නිසා මා රජ කරගෙන මා සමගම හිටපල්ලා යන්න ඒ පණිවුඩයයි.

එසේම "රට වෙනුවෙන් පොදු සිතුවිල්ලකට - පොදු එකඟතාවයකට එක්වෙන්න. අපි අපිටම පහනක් වෙමු." කියා ඔහු තමන්ගේ පාර්ලිමේන්තු සගයින්ට ආරාධනා කරයි. තමන්ව තදින්ම විවේචනය කළ පොදු ජන පෙරමුණේ අය තමන් සමග දැන් එක්වී සිටී නම් සමගි ජන බලවේගය නියෝජනය කරන, තමන් සමග බොහෝ කාලයක් එක්ව දේශපාලනය කළ අයට පොදු ගමනකට එක් විය නොහැක්කේ ඇයි දැයි ජනාධිපතිවරයා ප්‍රශ්න කරයි.

ජනාධිපති රනිල්ගේ පාර්ලිමේන්තු සැසිවාරය හදිසියේම කල්දමා විවෘත කර කථා පැවැත්වීමේ මූලික අරමුණ මේ ඉහත ප්‍රකාශයෙන් ජනතාවට මනාව තේරුම් ගැනීමට හැකිය. ඔහුට අවශ්‍ය වූයේ, තමන් සේවය කරන ධනේශ්වර පංතියේ පංති පැවැත්ම ආරක්ෂා කිරීම වෙනුවෙන් සියලු හොරුන්ට එකට එකතු වන ලෙස ආරාධනා කිරීමය. අනුර දිසානායක ෆයිල් ගෙදර ගෙනගොස් තියාගෙන ඉන්න කතාව සඳහන් කරන්නේ තමන් බලයට පත්කර නොගෙන ජනතාව අනුර දිසානායක ජනාධිපති කළහොත් පාර්ලිමේන්තුවේ ඉන්න හැමෝටම සිදුවන නස්පැත්තිය අවධාරණය කිරීමටය.

## උල්කාපාත හා රොකට්!

"අපේ ආර්ථිකය කඩා වැටුණේ උල්කාපාත වේගයකින්. නමුත් දැන් අපිට එය ආපිට හරවන්න පුළුවන් වෙලා තියෙනවා. එය රොකට් වේගයෙන් යළි ඔසවන්නට අප සමත් වුනා. වී (V) ෂේප් රිකවරි නැත්නම් වී (V) හැඩයේ ප්‍රතිසාධකයක් අප ලබමින් ඉන්නේ" මේ (V) හැඩයේ ජයග්‍රහණය ලෝක වාර්තාවක් ලෙස හැඳින්වීමටද රනිල් වික්‍රමසිංහ කථාව ලියා දුන් තැනැත්තා ඉක්මන්වී ඇත. මේ උල්කාපාත කඩා වැටීම රොකට් ජයග්‍රහණයක් ලෙසට උත්කෘෂ්ඨයට නංවා පෙන්වා දීමට ඔවුන් උදාහරණයට ගෙන ඇත්තේ 2022 පෙබරවාරි සිට 2023 පෙබරවාරි දක්වා වසරක කාලයයි. ඒ වසරක ඉලක්කම අතර වෙනස්කම් පෙන්වා මුළු අවුරුදු 75 ක මෙම පාලක පන්තියේ එකට හා වෙන්ව පාලනයේ දුර්වලකම් අභාග්‍යසම්පන්න ප්‍රතිඵලයන්හි විලි වසා ගැනීමට ඔවුන් අසාර්ථක උත්සාහයක් දරා ඇත. රනිල් වික්‍රමසිංහ තම රොකට් ජයග්‍රහණයෙන් ඉලක්කමට දමන විට ජනතාව පාරේ, වැඩපොළේ, ගොවිපොළේ විඳින ජීවත් වීමේ අරගලයේ පීඩාව අමතක කර ඇත්තේ හිතාමතාමය. අද ආහාර, අධ්‍යාපනය සහ සෞඛ්‍යය මිනිසුන්ගේ දෛනික ජීවිතයේ මූලිකම ප්‍රශ්න බවට පත්ව ඇත.

තුන්වේලක් කුමන හෝ ආහාරයකින් කුස පුරවා ගැනීමට අතිමහත් අරගලයක් කිරීමට මිනිසුන්ට සිදුව ඇත. පාසල් වාරය ආරම්භයේදී පාසල් පොත් උපකරණ සඳහා වියදම දැරීමට නොහැකිව අසරණව පාසල් හැරයන දරුවන් ගණන දිනෙන් දින ඉහළ යමින් තිබේ. පවතින ආර්ථික අර්බුදය හමුවේ තවදුරටත් මුහුණ දීමට නොහැකි තරුණ තරුණියන් රට හැරයාමට පාස්පෝට් පෝලිම්වල පොරකති. අත්‍යාවශ්‍ය බෙහෙත් හිඟය නිසා ජීවිත අහිමි වන රෝගීන් දිනපතා ඉහළ යයි. ඒ මූලිකම අවශ්‍යතාවයන් වත් ඉටු කිරීමට අසමත් පාලකයෝ තම බලය රැකගැනීමට ඉලක්කම් පම්පෝරි ගසති.




රනිල්ගේ ඉලක්කම් අනුව පසුගිය වසරේ 50.6%ක පැවැති උද්ධමනය දැන් 6.4%කට පහත වැටී ඇත. බැලූ බැල්මට එයද ඇත්තකි. උද්ධමනය එසේ අඩු වුවද රු. 15ට පැවැති බිත්තරය දැන් රු. 60කි. රනිල්ට බලය බාර දුන් රාජපක්ෂලා "ලූනු කෑවද" කියා රැස්වීම්වල අසන විට රු.35ට පැවති ලූනු කිලෝවක් දැන් රු. 420කි. රු.75ට පැවැති හාල් කිලෝවක් රු.260 - 300ට ගොස් ඇත. මහපොළවේ ඇත්ත යථාර්ථය එයයි. උද්ධමනය යනු සාපේක්ෂව බඩු මිල ඉහළ යෑමේ (වර්ධනයේ) ප්‍රතිශතය බව දැනගෙනම රනිල් උද්ධමනය සාර්ථකත්වයේ මිම්මකට යොදා ගනී. වසරක තාවකාලික වෙනස රොකට් ජයග්‍රහණයක් කර පෙන්වීමට රනිල් වික්‍රමසිංහලාට අවශ්‍යව ඇත්තේ ඊළඟ බල කරණම සඳහාම පමණි. එය ප්‍රතිපත්ති ප්‍රකාශනයක හුවා දැක්වීමේ අරමුණ අනුව මේ ඉදිරිපත් කර ඇත්තේ ප්‍රතිපත්ති ප්‍රකාශනයකට වඩා මැතිවරණ ප්‍රකාශනයක් බව පැහැදිලිය.

## ඩොලරය බැස්සීම

රනිල්ට අනුව එදා ඩොලරයක අගය රු.362කි. අද රුපියල් 314කි. ඩොලරයට සාපේක්ෂව රුපියල ශක්තිමත් වී ඇති බව බැලූ බැල්මට පෙනේ. එසේම දැන් ප්‍රාථමික ගිණුමේ හිඟය අතිරික්තයක්ද කරගෙන ඇත. 1977 පසු පළමු වතාවට ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ අතිරික්තයක්ද ඇති කරගත් පළමු අවස්ථාව මේ රනිල් හුවා දැක්වූ වසරට අයත්ය. නමුත් යථාර්ථ කථාව මීට ඉඳුරාම වෙනස්ය. පෙබරවාරි 07 රනිල්ගේ ප්‍රතිපත්ති කථාව දවසේ ඩොලරයක් රු. 314කි. අද මේ ලියන මොහොතේදී ඩොලරය රු.312කි. නමුත් මේ ඩොලරය ශක්තිමත් වන්නේ ආනයන ආදායම ඉහළ යාමෙන් අවශ්‍ය ආනයන රට තුළට ප්‍රමාණවත්ව ලැබීමෙන් ලද ආර්ථික වර්ධන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස නොව ආර්ථිකය තුළ මිලදී ගැනීමේ හැකියාව දරුණු ලෙස බිඳ වැටීමෙන් ඇතිවූ ආනයන ශක්‍යතාවය බිඳ වැටීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. වෙළඳ ශේෂයේ ක්‍රියාවලිය නිසා ප්‍රාථමික ගිණුම ශක්තිමත් විය හැකි අවස්ථා කිහිපයක්ම ආර්ථික විද්‍යාවේ පැහැදිලි කරන බව රනිල් නොදන්නවා වුණාට උසස්පෙළ හදාරන දරුවන්ද මනාව දන්නා කරුණකි. අපනයන ආදායම වැඩි නොවී ඒ ප්‍රමාණයෙන්ම පවතිද්දී ආනයන වියදම අඩුවුවහොත් වෙළඳ ශේෂයේ ධන තත්වයක් ඇතිවිය හැකිය. ඒ, එවැනි අවස්ථාවකි. අපනයන ආදායම නොවෙනස්ව හෝ අඩු වුවද ඊටත් වැඩි වේගයකින් ආනයන වියදම සීමාවීමද ආනයන සඳහා ආනයනකරුවන්ට ඩොලර් ඉල්ලුම අධෛර්යමත් කරන අවස්ථාවකි. දැන් ආර්ථිකයේ පවතින්නේ එවැනි තත්වයකි. වෙනදා වසරක ආරම්භයේදී ජනතාව ගෙවල් දොරවල් අලුත් කරමින් නව උපකරණ මිලදී ගත්තද අද ඒ සියල්ලම සීමාකර ඇත. ආහාරවලට පමණක් වියදම් කර, අනෙකුත් වියදම් කප්පාදු කර ඉතාම අමාරුවෙන් ජීවත්වන තත්වයට ඔවුහු පත්ව සිටිති. ඒ නිසා බැංකුවල ඇති අපනයන මගින් ලබන ඩොලර් ආනයන සඳහා වියදම් කිරීමේ ඉල්ලුම මෑත කාලයේදී පහළ යාම ඩොලරයට ඇති රුපියල් ගෙවීම අඩුවීමට හේතු වී ඇති බව ආර්ථික විශ්ලේෂකයින්ගේ මතයයි. මිලදී ගැනීම සීමා වීම ආර්ථික කටයුතු කඩා වැටීම, ආර්ථිකයේ සංකෝචනය දැන් රනිල් වික්‍රමසිංහම පාර්ලිමේන්තුවේදී ආර්ථිකය රොකට් වර්ධනයක් ලබා ඇති බවට පෙන්වීමට සාක්ෂියක් කර ගැනීම හාස්‍යජනකය.

ආර්ථිකය අර්බුදයට පිළිතුරු සෙවීමත් එදා වේලට ගැටගසා ගැනීමත් යනු කාරණා දෙකකි. අර්බුදයකට අවශ්‍ය විසඳුමකි. අර්බුදයක් කළමනාකරණය කර ගැනීම විසඳුමක් සඳහා මොරගාන්නක් පමණි. එක්කෝ එම කළමනාකරණයම අර්බුදය තවත් උත්සන්න කිරීමේ අවස්ථාවක්ද විය හැකිය. ඒ නිසා කළමනාකරණයේ පියවරයන්ද 11 වැනි පිටුවට

> ඩොලරය ශක්තිමත් වන්නේ ආනයන ආදායම ඉහළ යාමෙන් අවශ්‍ය ආනයන රට තුළට ප්‍රමාණවත්ව ලැබීමෙන් ලද ආර්ථික වර්ධන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස නොව ආර්ථිකය තුළ මිලදී ගැනීමේ හැකියාව දරුණු ලෙස බිඳ වැටීමෙන් ඇතිවූ ආනයන ශක්‍යතාවය බිඳ වැටීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. වෙළඳ ශේෂයේ ක්‍රියාවලිය නිසා ප්‍රාථමික ගිණුම ශක්තිමත් විය හැකි අවස්ථා කිහිපයක්ම ආර්ථික විද්‍යාවේ පැහැදිලි කරන බව රනිල් නොදන්නවා වුණාට උසස්පෙළ හදාරන දරුවන්ද මනාව දන්නා කරුණකි.



"පැරණි ධනපති සමාජයෙන් අපට ඉතිරි කර තිබෙන ලොකුම උවදුර සහ අභාග්‍යයන් අතුරෙන් එකකි, පොත් සහ ප්‍රායෝගික ජීවිතය අතර සම්පූර්ණ පරස්පරය. සියලු දේම හැකි අනර්ඝතම ආකාරයෙන් විස්තර කරන පොත් අපට තිබිණි. එහෙත් අති බහුතර ගණනක්ම අවස්ථාවල දී මෙම පොත්වල අන්තර්ගත වුයේ ඉතාමත් විනාශකාරී සහ වංචා සහගත බොරුය. ධනපති සමාජය ගැන බොරු විස්තරයක්ය."

**ලෙනින්**

**තෝරාගත් කෘති, 12වැනි වෙළුම, පිටුව 59**



# මේ, ගැහැනුන්ගේ වාරයයි!

මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනයයි. ලොව අන්කවර රටකටත් වඩා ලාංකීය කාන්තාවන්ට මෙවර කාන්තා දිනය සුවිශේෂී වෙයි. එයට හේතුව වන්නේ මාර්තු 08 යනු කාන්තාවන් වෙනුවෙන් ලොව පිළිගත් දිනය වුවද ලංකාවේ ගැහැනුන් මෑත කාලයේ පටන් සෑම දිනයක්ම ඔවුන්ගේ කර ගන්නට දිවා රෑ නොබලා වෙහෙස වෙන බැවිනි. සැබවින්ම මේ ගෙවන්නේ ගැහැනුන්ගේ වසරයි. ගැහැනුන් එක මිටකට එකතු වෙමින් හිඳින වසරයි. ඉතින් කාන්තා දිනය මහත් අභිමානයෙන් සමරන්නට ලාංකික ගැහැනුන්ට හැකිවන්නේ එබැවිනි.

මෙවර අප සමරනු ලබන්නේ 113 වන කාන්තා දිනයයි.

1908 ඇමෙරිකාවේ නිව්යෝර්ක්හි ඇඟලුම් කම්හල් සේවිකාවන් 15000ට අධික පිරිසක් සාධාරණ වැටුප්, ඡන්ද අයිතිය, වැඩ කරන කාලය කෙටි කිරීම හා ළමා ශ්‍රමය නවත්වන ලෙස ඉල්ලා කළ දැවැන්ත උද්ඝෝෂණය කාන්තා දිනය නම් කිරීමට හේතු විය. 1910 කෝපන්හේගන් නුවර පැවති සමාජවාදී කාන්තාවන්ගේ ජාත්‍යන්තර සමුළුවේදී ක්ලාරා සෙට්කින් කළ යෝජනාවට අනුව කාන්තා දිනය නම් කෙරිණි.

අද වන විට කාන්තා දිනය නම් කිරීමට මූලික වූ සියලු හේතු යටපත්ව ඇති බව අපට දක්නට ඇත.

වර්තමානය වන විට කාන්තා දිනයේ සැබෑ අරමුණු යටපත්වී වාණිජමය හා ලිබරල් ස්ත්‍රීවාදී අරමුණු පෙරට පැමිණීම කනගාටුදායක තත්වයකි.

ඉතිහාසය පුරාවටම ගැහැනුන් මුහුණ දෙන එකදු ප්‍රශ්නයකට හෝ විසඳුම් ලබා දීමට පාලකයන් සමත් නොවීම නිසා සමස්ත ගැහැනු පරපුරම දැඩි පීඩනයකට ලක්විය. ශ්‍රී ලංකාව තුළ ආර්ථික පීඩනය ඉහටත් උඩිනි. මුළුතැන්ගෙය තුළ ඇති ලිපක ඇවිළෙන ගින්නට වඩා ගෘහණියන්ගේ හදවත් තුළ ගිනි ඇවිළෙයි. මන්දපෝෂණයෙන් පෙළෙන, අධ්‍යාපනය අහිමි වන, ලෙඩ රෝගවලින් මිය යන තම දරුවන් වෙනුවෙන් සුසුම් හා කඳුළු සලන මව්වරුන්ගේ කඳුළු දකින්නට සමත් පාලකයන් එදා මෙදා තුර මෙරට පහළ වූයේ නැත.

ගෘහස්ථ හිංසනය විඳදරා ගනිමින් හෝ ඉවසාගෙන නුහුනු තැන දරුවන්ද සමග ගඟේ පැන සිය දිවි හානි කරගෙන හෝ ගෘහස්ථ පීඩකයාට මන්නා පහරදී සිරබත් කෑම විසඳුම ලෙස තෝරාගත් පීඩිත ගැහැනු කොතෙක් නම් මෙරට තුළ හිඳීද.

දරාගත නොහැකි වැඩ පීඩනය නිසා ආයතන තුළ හා වැඩබිම්වල සූරාකෑමට නිරන්තරයෙන් ලක්වන ගැහැනුන්ගේ ශ්‍රමයට නිසි වටිනාකමක් මෙතෙක් නොලැබුණි. ගැහැනියක නිසාම රැකියා උසස්වීම් අහිමිවීම හා ලිංගික සූරාකෑමට ලක්වීමද සුලබ සිදුවීම්ය.

මෙවැනි බොහෝ අර්බුදයන්ට මුහුණ දෙන ගැහැනුන් පිරිසක් ලාංකේය සමාජය තුළ ඇත. ගැහැනුන්ගේ ඡන්දයෙන් බලයට ආ සෑම පාලකයෙකුටම නැවත ගැහැනුන් සිහි වුණේ මැතිවරණයක් ආසන්නයේදී පමණක් වීම කනගාටුවට කරුණකි. සුරපුරයක් මවනවා යැයි සිහින පෙන්වා බලයට පත්වූ වර්තමාන ආණ්ඩුවද පුස්සක් බව දැන් පසක් කොට හමාරය. පින් ජනපතිගේ සහන ලැබෙන්නට 2048 වන තුරු ඉවසා බලා සිටින්නට ලාංකේය ගැහැනු සූදානම් නැත.

කෙසේ වෙතත් එදා ක්ලාරා සෙට්කින් පැවසූ පරිදිම සමාජවාදයෙන් තොරව ගැහැනුන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම සිහිනයක් පමණකි. ගැහැනුන් වන අප සමස්ත සූරා කෑමට හා පීඩනයට එරෙහිව සටන් කළ යුත්තේ පිරිමින් සමග නොව ධනපති ක්‍රමය සමග බව අප අවබෝධ කර ගත යුතුය. එසේ අවබෝධයෙන් කටයුතු කරන්නේ නම් පාලකයන්ට බොරු පොරොන්දු දී ගැහැනුන් රැවටීමට කිසි විටෙකත් හැකි නොවෙනු ඇත. දැන් ගම් නියම්ගම් සිසාරා ලක්ෂ ගණනින් ගැහැනුන් එක මිටකට එකතුවෙමින් හිඳින්නේ තවදුරටත් මේ බලලෝභී පාලකයන්ට තමන් රැවටීමට නොහැකි බව පසක් කරමිනි. තට්ටු මාරු ක්‍රමයට නිල්, කොළ දේශපාලකයන්ගේ බඩු මල්ලකට, ටකරං තහඩුවකට, වැසිකිළි පෝච්චියකට තමන් රැවටූ බව ගැහැනුන් අවබෝධ කරගෙන හිඳිති. ඔවුන් ඒ වෙනුවට දැවැන්ත සමාජ පරිවර්තනයක් අපේක්ෂාවෙන් ඒ වෙනුවෙන් සටන් කරති. 2024 වසරේ නිසැක ලෙසම බිහිවන ජනතාවාදී පාලනයක සක්‍රීය කොටස්කාරියන් ලෙස ඉතිහාසයට එක්වන ගැහැනුන් ලෙස ඔවුන් මෙවර කාන්තා දිනය සමරනු ලබයි.

එදා 1917වසරේදී රුසියානු කාන්තාවන් "පාන් සහ සාමය" ඉල්ලා සිටියිද කාලීන වැඩවර්ජනය ආරම්භ කර දින හතරක් ගත වන විට සාර්ට රජකම අත්හරින ලෙස බල කෙරුණි. එලෙසම ලාංකේය ගැහැනුන් එක මිටට එක්වීම තුළ සනිටුහන් වන්නේ ධනපති පාලකයන් සදාකාලිකවම ගෙදර යැවීම බව දැන් නොරහසකි.

ඒ සඳහා ශ්‍රී ලාංකික ගැහැනුන්ට නායකත්වය දීමට, එක මිටකට එකතු කළ ගැහැනුන් තවදුරටත් ශක්තිමත්ව එකට බැඳ තබන්නටද, ඔවුන් දැනුමෙන් සන්නද්ධ කරන්නටද අප සූදානම් බව මෙවර කාන්තා දිනයේදී අවධාරණය කරමු.

## අපි දැන් දිනන්නෙමු!

ඉපදුනේ රටක දුක් ගිනි දරන්න ද
තුන් යමේ ගෙතුළ පීඩා විඳින්න ද
ඈන්දුනේ එවැනි සුසුමක බරින් වෙද
ගැහැනුනේ හෙටත් කඳුළින් ගෙවන්න ද?

නැගුවේ අවලාද මහ පොළොවක සේමා
හැගුනේ හුදෙකලා දුක් ගැනවිලි බෝමා
බැලුවේ නැති පොතට තව ලියනුද තේමා
ළඳුනේ තවත් ඉවසන් ඉන්නද කෝමා?

වාසිය පිණිස බැඳි කඩතුරු ඉරා දමා
කාසිය බලය පරදන පෙරමුණක අරා
දාසිය ලෙස නොහිඳ නිවහල් හිසක් දරා
මේසය පෙරළලා සාදය කරමු නිමා

වැරදුනා තමයි දැන් අතීතෙන් උගන්නෙමු
ඈහැරිලා නිදා වුන් හීනයෙන් මිදෙන්නෙමු
වෙරදෙනා බිමක් වෙත සෙමෙන් පිය නගන්නෙමු
පැරදුනා තමයි අපි දැන් ඉතින් දිනන්නෙමු

## පුනරුද යුගයක් වෙනුවෙන් එක මිටට එක්වෙමු!



**චන්ද්‍රමාලී පෙරේරා**
**අයිතීන් උදෙසා කාන්තාවෝ - ජාතික කමිටු සාමාජිකා**

අද වන විට ලාංකේය ගැහැනිය 'ගැහැනු අපි එක මිටට' යන තේමාව මුල්කරගෙන දැවැන්ත කාන්තා බලයක් සංවිධානයක් ගොඩනගමින් ඉන්නවා. දිස්ත්‍රික් මට්ටමින් සමුළු පවත්වමින් එක් වන ඔවුන් දැවැන්ත සමාජ පරිවර්තනයක් සඳහා දැන් සූදානම්. සමාජ පරිවර්තනය වෙනුවෙන් සංවිධානය වී සියලු පීඩනයන්, සූරාකෑම් අහෝසි කරන විද්‍යාවේ තාක්ෂණයේ පුනරුදයක් ගොඩනගන, නිෂ්පාදන ආර්ථිකයක් තුළ රට සංවර්ධනය කරන ක්‍රියාවලියේ දී එයට නායකත්වය දීමට ගැහැනිය බලවේගයක් ලෙස පෙළගැසීම අනිවාර්යයක්.

නිදහස් නිවහල් සාධාරණ, යුක්තිගරුක සමාජයක් ගොඩනැගිම සේම ඒ තුළ ගැහැනිය සිරකර ඇති බැම්මවලින් නිදහස් කර සමාජීය කර්තව්‍යයන් සඳහා ඇය දායක කරගැනීම කළ යුතුමයි.

පහත්යැයි, දුබලයැයි සැලකූ ගැහැනියට ගෞරවනීය ලෙස ජීවත් වීමට ඉඩ ලබාදිය යුතුය. ඒ සඳහා ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති දිනවමින් තීන්දු තීරණ ගන්නා ස්ථාන තුළ සම නියෝජනයක් ලබා ගැහැනියගේ ප්‍රශ්නය පොදු ජයග්‍රහණය තුළම දිනා ගන්නට එක මිටට එක්වෙමු.

## මෙතරම් ගැටීම්, දුක් කඳුළු, තුවාල, ලේ වැගිරීම්, හා වෛරයෙන්, ක්‍රෝධයෙන්, අධෛර්යයෙන් පසුව

# අපි කුමක් කරමුද?

ඉග්නාසියෝ සිලෝනි ඉතාලි සාහිත්‍යය තුළ අපට හමුවන අග්‍රගණ්‍ය නිර්මාණකරුවෙකු ලෙස සැලකිය හැකිය. 1900 මැයි මස පළමුවැනි දා ඔහු මධ්‍යම ඉතාලියේ පෙස්සිනා නගරයේදී උපත ලැබීය. 1915 ඉතාලියේ ඇති වූ අවසාන භූකම්පනයෙන් ඔහුගේ පවුලේ සාමාජිකයින් රැසක් මියගිය අතර ඊට පෙර එනම් 1911 වසරේදී ඔහුගේ පියා මියගොස් තිබිණි. සිලෝනේ ඉතාලියේ තරුණ සමාජවාදී කණ්ඩායම් සමග සමීපව කටයුතු කළ පුද්ගලයෙක් විය. එමෙන්ම ඔහු ඉතා සක්‍රීයව කොමියුනිස්ට් පක්ෂයට හා සමාජවාදී පක්ෂවලට සම්බන්ධ වී වැඩ කරන ලදී. ඔහුගේ ලේඛන ශෛලිය ගොඩනැගීමට එහිදී කළ සංවිධාන ක්‍රියාකාරකම් මෙන්ම පරිශීලනය කළ පතපොත හේතු වී ඇති බව නිරීක්ෂණය වේ. 1921 වසරේදී සිලෝනේ ඉතාලි සමාජවාදී පක්ෂයේ සමාරම්භක සාමාජිකයකු බවට පත්විය. ඒ පක්ෂය විසින් පවත්වාගෙන ගිය 'ද වෝකර්' හෙවත් කම්කරුවා පුවත්පතේ ප්‍රධාන කතුවරයා වී ඇත්තේද සිලෝනේය. ෆැසිස්ට් රාජ්‍ය සමයේදී සැඟවී සිටිමින් සිය දේශපාලනය කළ ඔහු මනා පන්නරයක් ඉන් ලැබූ බව සඳහන්.

ඔහුගේ ෆොන්ටමාරා නවකතාවට පාදක වූයේ අබ්රුසෝ නමැති ප්‍රදේශයක පිහිටි මර්සිකා නමැති කල්පිත දිළිඳු ගම්මානයකි. ලෝකය පිළිබඳ කිසිවක් නොදැන සිටි එගම වැසියෝ ෆැසිස්ට්වාදයේ නැගීම පිළිබඳවද කිසිවක් දැන නොසිටියහ. කෘතියට පාදක වූයේ එගම වැසියන්ගේ කතා ප්‍රවෘත්තියයි. එම නවකතාවේ එක් ස්ථානයක සිලෝනේ විසින් ලියන මේ වාක්‍යය ෆොන්ටමාරා නවකතාවේ පදනමයි.

**"මෙතරම් ගැටීම්, දුක් කඳුළු, තුවාල, ලේ වැගිරීම්, හා වෛරයෙන්, ක්‍රෝධයෙන්, අධෛර්යයෙන් පසුව - අපි කුමක් කරමුද"**

එක් රාත්‍රියක, ෆොන්ටමාරාවේ තිදෙනෙක් - මවක්, පියා සහ පුතා - පිටුවහල් කරනු ලැබ සැඟවී සිටින ලේඛකයෙකුට තම ගමේ සිදු වූ විවිධ දේ ගැන කියති. මෙම සිදුවීම් සකසා පොතක් බවට පත් කිරීමට ලේඛකයා තීරණය කරයි. එම පොතේ වැඩි කොටසක් පියා විසින් ප්‍රකාශ කළද මව, පියා සහ පුතා යන තිදෙනාම එහි කථිකයෝ බවට පත්වෙති. කැව් පෙලිනෝ ගමට පැමිණ කැෆෝනි රවටා ෆොන්ටමාරා වෙතින් ගලා යන ජල මාර්ගය වෙනතකට හරවා ඔවුන් ජීවනෝපාය සලසා ගන්නා කෙත්වලින් ඉවතට රැගෙන යාමට කැමැත්ත පළ කිරීමේ පෙත්සමකට අත්සන් කිරීමට පොළඹවයි. ෆොන්ටමරේසි මුලින් අකමැත්තෙන් නමුත් සිදුවන්නට යන දේ සම්බන්ධයෙන් නිවැරදි වැටහීමක් නොමැතිව ඔවුන්ට ලබා දෙන හිස් කඩදාසි කැබලිවලට අත්සන් කරති. ඒ අතර ඔහු තවත් පත්‍රිකාවක් කඩදාසි ගොඩේ මුදුනේ තබයි. එහි සඳහන් යටින් අත්සන් කර ඇති අය, ඉහත ඒවාට සහය දක්වමින්, ස්වයංසිද්ධව, ස්වේච්ඡාවෙන් සහ කැව් පෙලිනෝ වෙනුවෙන් උද්‍යෝගයෙන් ඔවුන්ගේ අත්සන් සපයන්න යනුවෙන් සඳහන් වේ.

අනතුරුව සිය කෙත්වතු වෙත යන විට පිරිමින් දුටුවේ ආගන්තුක කම්කරුවන් පිරිසක් දිය ඇල්ල වෙනත් දිශාවකට හරවමින් සිටින බවයි. පිරිමි ළමයෙක් ප්‍රවෘත්තිය ගමට ගෙන යන අතර කාන්තාවන් ඒ සම්බන්ධයෙන් විරෝධතා දැක්වීමට ප්‍රාදේශීය අගනුවරට යයි. නව පාලනය යටතේ සින්ඩකෝ (නගරාධිපති) ඉතා යහපත් කෙනෙකු ලෙස පෙනී සිටින අතර ඔහුගේ ඇවැතුම් පැවැතුම් ගැන වැටහීමක් ගැමි ස්ත්‍රීන්ට නොවීය. එමෙන්ම නගරාධිපතිවරයාගේ අභිප්‍රායය සම්බන්ධයෙන් කිසිදු දැනුමක් ඔවුන් සතුව නොවීය. නගරාධිපතිවරයා විසින් මේ ගැමි ස්ත්‍රීන් ඉම්ප්‍රෙසාරියෝගේ (ධනවත් ව්‍යාපාරිකයෙකුගේ) නිවසට කැඳවාගෙන ගොස් බොහෝ සාකච්ඡා කිරීමෙන් පසු නැවතත් මුදාහරිති. එම සාකච්ඡාව සිදුව අවසන් වන විට නගරාධිපතිවරයා තවදුරටත් සොයා ගැනීමට නොහැකි තත්වයට පත්වේ. එනයින් බලන විට දිය ඇල්ල හැරවීමට අනුමැතිය ලබා දුන්නාක් මෙන්ම ඒ සම්බන්ධයෙන් පැවැති සාකච්ඡාවේදී ඔවුන් නැවත රවටනු ලැබ ඇත. Don Circonstanza සහ Impresario ජලයෙන් හතරෙන් එකක්/තුනක් බෙදීමක් පිළිගැනීමට ඔවුන්ව පොලඹවන නිසා. Impresario විසින් tratturo (බැටළුවන් සංක්‍රමණය සඳහා භාවිතා කරන ප්‍රජාවට අයත් පැතලි ඉඩම) ද පැහැරගෙන ඇති බව පැහැදිලි වේ. බෙරාර්ඩෝ වයෝලාට ඇමරිකාවට සංක්‍රමණය වීමට අවශ්‍ය නමුත් නව ආගමන නීති මගින් එය වළක්වනු ලැබේ. ඔහු තම විගමනයට අරමුදල් සැපයීම සඳහා ඔහුගේ ඉඩම දොන් සර්කොන්ස්ටන්සාට විකුණූ නමුත් දැන් ඉඩමක් නොමැතිව ඉල් කැෆෝන් සෙන්සා ටෙරා (ඉඩම් නැති ගොවියා) ලෙස හඳුන්වනු ලබන අතර රැකියා විරහිතව සිටින අතර ඔහුගේ ආඩම්බරය නිසා මැඩෝනා හෙවත් පෙම්වතිය වන එල්විරා සමග විවාහ වීමට නුසුදුසු යැයි හැඟේ. රැවටීමට ලක් වන ජනතාවගේ ඊළඟ සිතිවිල්ල වන්නේ හෘද සාක්ෂියේ වරදකාරී හැඟීමයි.

මේ අතර ඉතාලියේ ඒකාධිපතිවාදය වර්ධනය වේ. නගරය ගැන අසාවත් නොමැති ජනතාවක් වන ෆොන්ටමාරා වැසියන්ට තමාගෙන් සැතපුම් සිය ගණනක් ඈත සිදුවන ඒකාධිපති නැගීමේ බලපෑම දැනෙන්නට පටන් ගනී. කැව් ෆොන්ටමාරසිය නව ෆැසිස්ට්වාදී පාලන තන්ත්‍රය සමඟ සහයෝග යෙන් කටයුතු නොකරන බව (නොදැනුවත්කම තුළින්) පෙලීනෝ රජයට දන්වන අතර Innocenzo la Legge ඇඳිරි නීතිය පැනවීමට පැමිණේ. ඇඳිරි නීතිය පැනවීම ඔවුන්ගේ වැඩකටයුතුවලට දැඩි ලෙස බාධාවක් වන අතර ප්‍රසිද්ධ ස්ථානවල දේශපාලනය කතා කිරීම තහනම් කරයි. මේ අතර බෙරාඩෝ ඉන්නොසෙන්සෝට විරුද්ධව කතාවක් කරයි. ඉන් ඔහු නින්දාවට පත් වෙයි.

ෆොන්ටමාරා දේශපාලන නවකතාවක් වුවද එහි එන චරිත වර්ගයා, දේශපාලන බල ක්ෂේත්‍රයෙන් සාමාන්‍යයෙන් ඈත්ව ජීවත් වන්නෝය. එමගම් වැසියන්ට දේශපාලනය යන වචනය පවා කිසිදු තේරුමක් ගෙන නොදෙන වචනයකි. ෆොන්ටමාරාව ඉතාලියේ නගරයෙන් බොහෝ ඈත පිහිටි, නගරයේ කිසිදු චලනයක් ගැන කිසිදු හැඟීමක් නොදැනුනු ගම්මානයකි. එක් දිනක්, මුසලෝනිගේ ෆැසිස්ට් හමුදාව ෆොන්ටමාරාවට පැමිණෙයි. ගැමියන්ට වැටහෙන ආකාරයට ඔවුන්ට විනාශ කිරීමට අවශ්‍ය වූයේ දෙකකි. මේ දෙකෙන් එකක් මනස පෝෂණය කරන අතර අනෙක උදර පෝෂණය කරයි. සෑම ඒකාධිපතියෙක්ම ජනතාවගේ අවනතභාවය ලබා ගැනීමට විනාශ කරන දෙකම මුසලෝනිද තෝරා ගත් බව මෙමගින් සනාථ වේ. එනම් ඒ පත්තරය හා ගොවි බිම්ය.

කිසිත් නොදන්නා ගම්මානයක "ගැමියෝ" ඒකාධිපතිවාදයේ මුල්ම පැමිණීම දකින්නේ අසාමාන්‍ය විසිතුරු බවකිනි

"ඒ වන්දනා ගමනක්! වන්දනා ගමනක්!" සොකානීරා කෑ ගැහුව. "දැන් කාලේ වන්දනාකාරයෝ පයින් යන්නේ නෑ. ඒ අය යන්නේ කාර්වලින්! ඒ අපේ සැන්රොකාට වන්දනා ගමනක්!"

"නෑ ඒක කාර් රේස් එකක්!" ටවුමක යුද්ධ හමුදාවේ ඉඳල තිබුණ පැස්ක්වෙලා සිපෝලා කිව්ව. "කාර් එලවන අය හුඟක් එක එකාට අභියෝග කරල, වේගෙන් යන්න පුළුවන් කාටද කියලා හොයන්න ටවුමේ හැමදාම කාර් රේස් දකින්න පුළුවන්!"

හැම මිනිත්තුවකම ලොරිවල සද්දේ එන්න එන්නම වැඩි වුණා. ඒ වගේමම, පස්සේ අපට ඇහුණා, ලොරිවල හිටිය මිනිස්සුන්ගේ දරුණු කෑ කෝ ගැසීම්! පල්ලියේ ජනේලෙන් වැටුණු වීදුරු එක්ක ආපු පට පට ගෑව දරුණු පිපිරීම්වලින්, අපේ කුතුහලේ භයකට හැරෙව්වා.

"උන් වෙඩි තියෙනව! වෙඩි තියෙනව! උන් පල්ලියට වෙඩි තියෙනව! උන් අපට වෙඩි තියෙනව!"

"ඇත්ත, ඉස්සෙල්ල පල්ලියට වෙඩි තිව්ව උපන් පස්සෙ අපට වෙඩි තිව්වා. ඉස්සෙල්ල පල්ලියට බෝම්බ ගහපු උන් ඊට පස්සේ අපට බෝම්බ නොගහ ඉන්නයි කියන්න කිසිම සාධාරණ පදනමක් නෑ"

ෆොන්ටමාරා කතාව සම්බන්ධයෙන් ඉග්නාත්සියෝ සිලෝනේ විසින් දක්වන මෙම අදහස ඉතා වැදගත්ය.


"මම මේ ලියන යන දේ සිද්ධ වුණේ පසුගය ගිම්හානේ ෆොන්ටමාරාවේදී. අලුතෙන් අස්වද්දපු ෆූසිනෝ විලට උතුරින් මාසිකාවල තිබුණු පැරණිම දුප්පත්ම ගම්මානය විදිහට ෆොන්ටමාරාව හිතේ තියාග න්න. කාලෙන් කළු ගැහුණු, හුළගෙනුයි වැස්සෙනුයි දුබල වෙලා ගිය, හැඩයක් නැති, ජරාපත් වනු පැලපත් සීයක් විතර ෆොන්ටමාරාවේ තිබුණා. ඒවා හෙවිල්ලා තිබුණේ උළුවලිනුයි, හැම ජාතියේම ගල් පතුරුවලිනුයි. මේ පැල්පත්වලින්, ගල් කඳු මුදුනක් උඩ තිබුණ ජරාජීර්ණ වෙලා ගිය පල්ලිය වටවුණා. බිමට ගල් අල්ලල නැති මේ පැල්පත් බොහොමයක, දොරටත්, ජනේලෙටත්, දුම්කවුළුවලටත් තිබුණේ එකම එක විවරයක් විතරයි. ඒ පැල්පත් ඇතුළෙ මිනිස්සු, ගෑණු, ළමයි, බූරුවෝ, එළුවෝ, කිකිළියෝ ජීවත් වෙනව. නිදාගන්නව. කනව. උන්ගේ ජාතිය බෝ කරනව."

ඉකුත් සියවස මුල් භාගයේ දී ෆොන්ටමාරා නම් වූ එම ප්‍රත්‍යන්ත ඉතාලි ගම්මානයෙහි වැසියන් අත් විඳි සූරාකෑම, රැවටීම හා ඔවුන්ගේ ජීවිත තුළින් ඉවත නොයන සේ කිඳා බැස ගත්තා වූ දුගීභාවය මෙම විසි එක්වන සියවසට ආගන්තුක වූ සංසිද්ධියක් නොවේ; එම සූරාකෑම හා රැවටීම ඉතා සූක්ෂ්ම ලෙස, සුමට කෲරත්වයකින් යුතුව වත්මනෙහිද සිදුවෙමින් පවතී. වත්මන් රාජ්‍ය පාලකයෝද, අසාධාරණ හා කූට උපා මං මගින් අපරිමිත ධන සම්පත් භුක්ති විඳින්නෝද ඇතැම් ආගමික නායකයෝද මෙම කල්පිත ගම්මානයෙහි දිවි ගෙවූ ඇතැමුන්ගේ ප්‍රතිරූපම නොවන්නෝද? වත්මන් ගොවි - කම්කරු ජනතාව හා එම ෆොන්ටමාරා වැසියන් අතර සමානතා බොහොමයකි. මොවුහු ද ෆොන්ටමාරා වැසියන් මෙන් රැවටෙති, යළි යළිත් රැවටෙති."

ෆොන්ටමාරා නවකතාවේ තවත් සුවිශේෂ ලක්ෂණයක් වන්නේ එය වර්තමාන සමාජයේ ඒකාධිපතීන් හා භයානක නරුමයින් හැසිරෙන ආකාරය මැනවින් චිත්‍රණය කර තිබීමයි. උදාහරණයක් වශයෙන් කොන්ත්‍රාත්කාරයාගේ ගෝලයා ඔත්තු බැලීම සඳහා පත් කරන්නේ සෙසු සියල්ලන්ටම පෙර නින්දට යන, කුසීත මිනිසෙකි. සියල්ලෝම ඔහුගේ නිවටකමට සිනා සෙති. එහෙත් අවසන එසේ නිවට මිනිසෙකු පත් කළ කොන්ත්‍රාත්කාරයා ගම සමූහ දූෂණයට මෙන්ම සමූල ඝාතනයටද ලක් කරයි.

සාහිත්‍යකරුවෙකු වශයෙන් ඉග්නාත්සේ සිලෝනේ විසින් ලෝක සාහිත්‍යයට කළ අනුපමේය මෙහෙය බොහෝ දෙනාගේ ඇගයුමට ලක් වී තිබේ. සිලෝන් එදා මෙදා තුර ලෝ පහළ වූ විශිෂ්ටතම දේශපාලනික නවකතාකරුවා යැයි හැඳින්වීම නිවැරදිය. දේශපාලන මාතෘකාවකින් තොරව කිසිවක් ඔහු විසින් ලියා නොමැත. ඔහු සිය අවසාන කාලයේ දී බරපතළ ලෙස රෝගාතුරව සිට 1978 අගෝස්තු 22 දා මිය ගියේය.





''ජීවිතයට ප්‍රශ්න එන්නේ ඔබ විනාශ කිරීමට නොවේ. ඔබ තුළ සැඟවුණු ශක්තීන් සොයා ගැනීමට ඔබට උදව් කිරීමටය."

**අබ්දුල් කලාම්**

# පොලිටිකල් පංතිය

මේ දවස්වල පොලිටික්ක එන්නෙ දවල් වෙලා. ළමයි සෙල්ලම් කරන්නවත් එළියට බහින්නෙ නැත්තෙ රස්නෙ උහුලන්න බැරිකමට. මොනව කරන්නෙත් පංතිය ඇතුළෙමයි.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය පොලිටික්ක දොර යන්තමට ඇරගෙන පංතියට රිංගනකොටම කිවුව.

"වෙරි ගුඩ් මෝනිං සර්" අනුරුද්දියා සද්දෙට කිවුව පාරට තමයි ළමයි දැන ගත්තෙ පොලිටික්ක ආවා කියල.

"දැන් ගුඩ් මෝනිං කියන්න පුළුවන්ද දන්නෙත් නෑ" කවුද කියල හරියටම නිනව්වක් වුණේ නැති වුණත් කවුරු හරි කඩප්පුලිකමට කියද්දි ඇහුණු අයට හිනා පැන්න.

"අපෝ...තව පුළුවන්" කනිය කියනකොට හැමෝගෙම වගේ මූණු බිත්ති ඔරලෝසුව දිහාට හැරුණා.

"ආයුබෝවන් ළමයිනේ" පොලිටික්ක දුර දිග බලල කිවුවට ලැජ්ජාවකුත් මූණෙ තිබ්බ. "ඔය ළමයි දන්නවද අන්න මන්ත්‍රී කෙනෙක් ඉල්ලා අස්වෙලා" පොලිටික්ක කතාව වෙන පැත්තකට නැව්ව.

"කවුද... සර් කියන්නෙ දුටුගැමුණු ගැනද?" මංජුව හැරෙන තැපෑලෙන් උත්තර බැන්ද.

"ඉතිහාසෙ විහිළුවට ගන්න එපා ළමයෝ. දුටුගැමුණු රජ්ජුරුවෝ මෙතනට අදාළ නෑනෙ" පොලිටික්කට හිත හරි නෑ.

"නෑ සර් මං ඇත්ත කිවුවෙ. දුටුගැමුණු තමයි ඉල්ලා අස්වෙලා තියෙන්නෙ" මංජුව අත් දෙකම මේසෙ උඩ තියල දිවුරුවා.

"ඔව් සර් එයා තමයි", "ඔව් ඔව්", "මිනිහා තමයි" තැන් තැන්වලින් මතු වෙද්දි පොලිටික්ක ඩාං වුණා... ඩුං වුණා.

"ඇත්තද එයාට කියන්නෙ දුටුගැමුණු කියලද?" පොලිටික්ක ඇකිළුවා... "මම හිතුවෙ ඉතිහාස කතාව කියල"

"ඔව්නෙ... අනුරාධපුරෙන් දියවන්නාව පැන්නෙ ටීටරේ දුටුගැමුණුට ඇඳලනෙ" චමිය අස්සය පිටේ යනවත් පෙන්නනව.

"ආන් දැන් පොර කැනඩාවට පැනලලු" කනියගෙන් තවත් හෙළිදරව්වක්... "ජීවිත තර්ජන කතාවකුත් කියන්නෙ"

"මේ යක්කු ඉතිහාසෙටත් අපහාස කරනව" පොලිටික්ක විස්සෝපෙන්.

"කලින් තව කෙනෙකුත් ඉල්ලා අස්වුණා නේද... අර බදුල්ලෙන් ආව කෙනා" අනුරුද්දියත් හරි හරියට අප්ඩේට්.

"ඔව් එයාට මන්ත්‍රී කෙනෙක් වෙලා ඉන්න ලැජ්ජයි කිවුවනෙ... මිනිස්සු මන්ත්‍රීවරුන්ව දියවන්නාවෙ කිඹුලම කාපිය කිවුව කියල" සුමිය හිස්ට්‍රිය දිග ඇරිය.

"එතන වෙන ගනුදෙනුවකුත් වුණා කියල කතාවක් ගියා... ඒ දවස්වල" මංජුව අත නවල කමිස සාක්කුවට ඇඟිලි දෙකක් එබුව.


"ඇත්තට මොකද මේ අයින් වෙන්නෙ. කොච්චර වියදම් කරගෙනද මෙයාලා ආවෙ" කනිය අහස පොළොව ගැට ගහනව.

"වෙන වෙන හේතු දානව වෙන්න පුළුවන්. ඒත් හැමෝම දන්න දේ තමයි ගිලෙන නැවෙන් මීයො පනිනව කියන එක" සමන කෙටියෙන් කිවුව. "මෙහෙම කෙටියෙන් කිවුවට මේක සරල නෑ. කට්ටිය දුර දිග බලනව. තමන්ට ආයෙත් දියවන්නාවට ගොඩ වෙන්න ලැබෙන්නෙ නෑ කියල ගණන් බලන අය දන්නව. මේ පනින පැනිල්ලෙ ක්‍රම ගොඩක් තියෙනව. එක්කො මේක ගාණකට විකුණගෙන ජීවත් වෙන්න පාරක් පාදගන්න ඕනෙ. නැත්නම් ඩිප්ලොමැටික් පාස්පෝට් එක පාවිච්චි කරලා ගිලෙන්න කලින් ලොකු රටකට ප්ලේන් එකෙන් පැනගන්න ඕනෙ. දැන් ඔය තව සමහරු ආයෙත් සැරයක් බෝඩ් වෙන්න පුළුවන්ද බලන්න තමයි කල් ඇතුව ආණ්ඩුවෙන් අයින් වෙලා විපක්ෂෙට ආවෙ... තව අය ස්වාධීන වුණේ. ඒකත් නැවෙන් පනින විදිහක්. පස්සෙ නැව ගිලෙනකොට 'අපිනම් ඔය නැව් දන්නෙත් නෑ අපි ඕවල ආවෙත් නෑ' වගේ කතා කියන්න බලාගෙන තමයි මේ කල් ඇතිව අයින් වෙලා තියෙන්නෙ...

බැලූ බැල්මට පාර්ලිමේන්තුවට ගෙඩි පිටින් අවුරුදු එකහමාරක් තියෙනවා. ඒත් දැන් හැමෝම දන්නව මේ අවුරුද්දෙ ජනාධිපතිවරණෙන් පස්සෙ පාර්ලිමේන්තුව විසුරෝනව කියල. මේ ජන මතයක් නැති පාර්ලිමේන්තුව තියාගන්නෙ නෑ... ඉතින් උන්නත් දාහයි මළත් දාහයි කියල අයින් වෙනවා. ගොඩදෙනෙක් අන්තිම වෙනකම් අල්ලන් ඉන්න බලනව... ලැජ්ජාවට. නැත්තම් දැන් ටක්කෙටම දන්නව ආයි බෝඩ් වෙනව කියන එකනම් සුම්මා කියල. රැස්වීම් තියල ජවිපෙ, ජාතික ජන බලවේගය, මාලිමාව, අනුර දිසානායක කියල කේන්තියෙන් වගේ කියෝගෙන කියෝගෙන යන්නෙ එයාල තමා... බයයි කේන්තියයි එකට එකතු වුණාම එළියට පෙන්නෙ පිස්සු කියලම තමයි." සමනගෙ කතාව ඉවර වෙනවත් එක්ක අත්පුඩි සද්දෙ මැද්දෙ පොලිටික්ක හීනියට කැන්ටිම පැත්තට දිරාමාරු වුණා.

## කවුළුව හැරඹි තබමි

# "කොහොම නැණ පහනක්ද නිවුණේ කෙලෙස හදකද ගැස්ම සිඳුනේ"



1883 මාර්තු 14 මාක්ස් මිය ගියේය. මේ ගෙවෙන්නේ ඔහු මිය ගොස් 141 වන වසරයි.

ඉහත සඳහන් කාව්‍යමය වැකි දෙක මාක්ස් මිහිදන් කළ හයිගේට් සුසාන භූමියේ ඔහුගේ සොහොනමත කොටා ඇති බව අප කියවා ඇත.

'මාක්ස්' සමස්තයම එහි ගැබ්ව ඇතැයි අපේ වැටහීමය.

මාක්ස් අවසන් කටයුතු සිදුකළ මොහොතේ එංගල්ස් තම කෙටිකථාවේදී මෙසේ කීවේය.

"මිනිස් සංහතිය එක හිසකින් පහත් විය. එපමණක්ම නොව අපේ කාලයේදී පැවැති ඉතාම වැදගත් ශීර්ෂය එය විය" මාක්ස්ට අවසන් ගෞරවය දක්වමින් විල්හෙල්ම් ලීබ්නෙච්ට් ජර්මන් බසින් මෙසේ කීවේය.

"වියෝගය නිසා අප දුක්වන, මියගිය තැනැත්තා වෛරයේදී මෙන්ම ආදරයේදීත් ශ්‍රේෂ්ඨ විය. ඔහුට එල්ල වූ වෛරයම එහි ප්‍රභවය වශයෙන් තිබුණේ ආදරයයි"

"ස්වභාව විද්‍යාවෝ අප දෙවියාගෙන් නිදහස් කරති. එහෙත් දෙව්ලොව දෙවියා, විද්‍යාව විසින් ඔහු මරා දමා ඇතත්, තවම ජීවත්වන්නේය"

"වැලපෙනවා වෙනුවට අපි මියගොස් සිටින ශ්‍රේෂ්ඨ පුද්ගලයාගේ ජීවගුණයෙන් යෙදී ක්‍රියාකරමු." ඔහු යම් ධර්මයක් ඉගැන්නුවේද, යම් ධර්මයක් පිණිස සටන් කළේද? ඒ ධර්මය හැකිතරම් ඉක්මනින් භාවිතාවේ යෙදීම පිණිස අපේ මුළු ශක්තියෙන් වෙර දරමු. මේ ඔහුගේ මරණයට ගරු කළ හැකි හොඳම පිළිවෙළයි.....

"මියගිය, ජීවත්වන මිත්‍රය අපි ඔබ අපට පෙන්වූ මඟ අනුව අවසන් අරමුණ කරා යන්නෙමු" සහශ්‍රයේ ශ්‍රේෂ්ඨ තම මිනිසාණෙනි, මානව වර්ගයා අතර ඔබ සදා ජීවමානය !

# ලක කැළඹූ දිනයන්



අනුර කුමාර සහෝදරයා දින 5කට ඉන්දියාවේ ගියේය. ඒ කුමකටද කියා දැන් කවුරුත් දනිති. කාරණය එය නොවේ. ඔහු ඉන්දියාවේ ගියා පමණි. දෙව්ලොව කැළඹුණි. බොහෝ දේශපාලන දෙව්වරුන්ගේ කිහිලිවලින් දහඩිය බේරෙන්නට පටන් ගත්තේය. සමහරු සිහිමුර්ඡා වූහ. සමහරු උමතුභාවයට පත්ව එක එක විකාර කථා දොඩන්නට පටන් ගත්තෝය. සමහර වන්දිභට්ට 'මාධ්‍ය' පිසාචයෝ අනුර සහෝදරයා පෙරළා පැමිණි විට ඇසීම සඳහා ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන ප්‍රශ්න පත්‍ර සූදානම් කළෝය. ඡන්ද කතා, ඩීල් කතා, කිරි කතා එකට අනා, කලතා සතියක් පමණ මාධ්‍ය වෙළඳාමේ යෙදුණෝය.

දේශපාලනය සූදුවක් කරගත් උන්ට හැම දෙයක්ම සූදුවකි. එය වාණිජ ව්‍යාපාරයක් කරගත් එවුන්ට එය වෙළඳාමකි. එය ඩීල් එකක් කරගත් එවුන්ට එය ඩීල් එකකි. එතනදී උන් හුරුවී සිටින සහ අනුගත වී සිටින දේශපාලන සංස්කෘතියේ දෘෂ්ටි කෝණයෙන් සියල්ල දෙස බැලීම ස්වභාවිකය. එය වෙනම කතාවකි.

අනුර වෙනුවට සජිත් හෝ නාමල් ඉන්දියාවේ ගියා නම් ඒවා රාජ්‍යතාන්ත්‍රික ගනුදෙනුය. එවිට බොහෝ මාධ්‍යවල වැයුම් ගැයුම් එමටය. ඒවා ලාංකේය දේශපාලනයේ නව නායකත්වයේ සුබ පෙරමග ලකුණුය.

ලංකවේ ප්‍රභූ දේශපාලනය හා ලංකාවේ තවමත් වැඩවසම්වාදී මාධ්‍ය භාවිතයෙන් මිදෙන්න බැරි මාධ්‍ය කලාවේ හැසිරීම එබඳුය.

දැන් අනුර ලංකාවට ඇවිත්ය. සියල්ලට උත්තර දුන්නේය. පජාතවාදියෝ නිහඬය. දැන් උන් බලා සිටින්නේ ඊළඟට එල්ලෙන්නේ කුමකද කියාය. - පච්!

# ආතල් කී ද ජංගල්

මෝඩයෝ සිඟිති ආතල් ගන්න එකට බජාර් එකේ කොල්ලො කියන්නේ 'ආතල් කී ද ජංගල්' කියාය. මෙහි වාචික තේරුම අපිද නොදනිමු. නමුත් ඉන් කියැවෙන හැඟවුම් කාරකය තේරුම් ගැනීමට එය බාධාවක් නොවන බව නම් පෙනේ.

තාත්තා කළ දේ නොකළොත් උෟ නොට්ටිගෙ පුතා යැයි ගැමි වහරේ කියමනක් තිබේ. මේ කතාව රජ තැනැත්තෙකු සහ ඔහුගේ මල් කුමරෙකු ගැනය. තාත්තා මහින්දය. පුතා නාමල්ය. තාත්තාට උඩු රැවුලකි. පුතාද උඩුරැවුලක් වවාගෙනය. තාත්තා සාටකයක් දමයි; පුතාද දමයි. තාත්තා මල් වට්ටි පූජා වට්ටි ගෙන පන්සල් දේවාලවල ගියේය; දැනුද යන්නේය. පුතාද දැන් ඒ පාරේම යමින් මල් වට්ටි ගෙන පන්සල් යන්නේය.

කලක් තාත්තා දක්ෂ දේශපාලන නළුවෙකු විය. ඒ කුසලතාව පාවිච්චි කළ ඔහු රටේ බහුතරයක් ජනයාට නාස් ලනුව දැම්මේය. ජනයාද ඊට හසුවිණි. දැන් රටේ ජනයා ඒ ගොනා විකුණා ගොඩක් කල්ය. දැන් අර තාත්තාගේ පුතාද පරණ ඇඳුම්ම පරණ කඹයද, පරණ මේකප් එකද දමාගෙන පරණ බසින්ම ජනයා ආමන්ත්‍රණය කිරීමට පටන්ගෙන තිබේ. ඒ මේ සිරිලක අනාගත ජනාධිපති වීම සඳහාය. අර තාත්තා හතර ගාතයෙන්ම ඇවිදිමින් පුතාව රජකරවීමට නොගන්නා වෙහෙසක් නැත; නොවිඳිනා දුකක් නැත. ඒත් තාත්තාගෙන් ණයට ගත් ඇඳුමින් ණයට ගත් භාෂාවෙන් ණයට ගත් මේකප් සහ ඇක්ෂන්වලින් දැන් රටේ ජනයා කිසිසේත්ම ඇන්දිය නොහැක. දැන් ඕගොල්ලන්ට ඇඩ්‍රස් නැත. ඕගොල්ලේ ඉන්නේ අනන්‍යතා අර්බුදයකය. ඔය ගොං ආතල්වලින් ඒවාට උත්තර නැත. කොටින්ම රටේ ජනතාව දැන් බලන් ඉන්නේ ඔය ගොල්ලන්ට කටඋත්තර නැති වෙන්නම උත්තර දීමටය. එතකං "ආතල් කී ද ජංගල් නාමල්...!"



# ජනාධිපති කියන 'ස්ථාවරත්වය' වෙනුවෙන්

# රටේ බහුතරයක් විශාල වන්දියක් ගෙවනවා

*(ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)*

රනිල් වික්‍රමසිංහ ජනාධිපති ලෙස මේ පාර්ලිමේන්තුවෙන් පත්කළාට පසුව කීපවතාවක්ම ඔහු පාර්ලිමේන්තුව තුළ ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාගත් විදිය අපි දැක්කා. ප්‍රතිපත්ති ප්‍රකාශනවලට වඩා ඔහු පාර්ලිමේන්තුවත් දැන් තමන්ගේ දේශපාලන බල ව්‍යාපෘතිය සඳහා පාවිච්චි කරන බවක් තමා අපිට දකින්න තියෙන්නේ. ඇත්තටම ඔහු මේ ක්‍රියාකරන විදිය තුළින් අපේ ප්‍රජාතන්ත්‍රවාදයත්, පාර්ලිමේන්තු ක්‍රමයත් බලවත් තර්ජනයකට ලක්කරනවා කියන හැඟීම මේ වෙලාවේ තියෙනවා. විධායක ජනාධිපති ක්‍රමය භාවිතා කරමින් පාර්ලිමේන්තුවත්, අධිකරණයත් තමන්ගේ බල ව්‍යාපෘතිය සඳහා පාවිච්චිකරන අන්දම අපිට මේ වෙලාවේ දකින්න පුළුවනි.

ඇත්තටම ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු ක්‍රමය පවත්වාගෙන යාමට මේ සියලුම ආයතන අතර බල තුලනයක් තිබීමේ වැදගත්කම අපි සියලුදෙනා දන්නවා. නමුත් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මේ වෙලාවේ ඇත්තටම කරන්නේ ව්‍යවස්ථා අර්බුදයකට අපේ මේ ක්‍රමය තල්ලු කරන එකයි. පාර්ලිමේන්තුවත් අධිකරණයත් තමාගේ බලපෑමට යටත් කරන්න ව්‍යවස්ථාවෙන් විධායකයට දීල තියෙන සෑම අවස්ථාවක්ම ඔහු පාවිච්චි කරන බව ඉතාමත් පැහැදිලියි. මේක ඉතාමත්ම දැනුවත්ව සැලසුම් සහගතව ඔහු කරන දෙයක් හැටියට අපි දකින්නේ. මේක අතිශයින්ම භයානකයි. ඉදිරියේදී ව්‍යවස්ථා අර්බුදයකටත් ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල වන දිසාවකටත් තල්ලුකිරීමේ උපායමාර්ගයක් බවත් පැහැදිලියි. ජනාධිපති රනිල් වික්‍රමසිංහ ඇත්තටම ප්‍රතිපත්ති ප්‍රකාශනයක් නෙවෙයි දවස් දෙකකට ඉස්සෙල් ඉදිරිපත් කළේ. ඔහුගේ දේශපාලන මැදිහත්වීමක් පෙන්නුවේ. 2048 වන තෙක් බලයේ සිටිය යුතුයි කියන පණිවිඩය සන්නිවේදනය කිරීමටත් ඒ සඳහා පාර්ලිමේන්තුවත් අධිකරණයත් ව්‍යවස්ථා සභාවත් ඔහුට අනුගත විය යුතුයි කියන පණිවිඩය දෙන්න දෙන්න තමා ඔහු මේ ප්‍රතිපත්ති ප්‍රකාශන අවස්ථාව පාවිච්චි කරන්නේ. මේක අතිශයින් භයානක දෙයක්.

දැන් කාලයක් තිස්සේ ඔහු නිර්මාණය කරන කථාවක් සමාජගත කරන්න හදනවා. අවුරුදු දෙකකට කලින් රට බංකොලොත් වුණා. දැන් ඔහුගේ නායකත්වය තුළින් රට ස්ථාවර කර තියෙනවා. ඒ ස්ථාවරවීම දැන් ආර්ථික සංවර්ධනය දක්වා ගෙනයාමට නම් මේ බලය තුළ ඔහු සිටිය යුතුයි. 2048 වන තෙක් ඔහු සිටිය යුතුයි කියන කියන කතාන්දරය සමාජගත කරන්න තමා ඔහු උත්සාහ කරන්නේ. ඒ සඳහා තමයි ඔහු මේ පාර්ලිමේන්තුවත් පාවිච්චි කරන්නේ. ඔහුට අමතක වෙන කතාව තමා, ඔහු කියන ස්ථාවරත්වය ලබා ගැනීම සඳහා මේ රටේ බහුතරයක් විශාල වන්දියක් ගෙවා තියෙනවා; ගෙවමින් සිටිනවා යන්න. ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ආර්ථික ස්ථාවරත්වය ලබා ගැනීම සඳහා ජනතාවගේ දෛනික දෛනික ජීවිතය, සෞඛ්‍ය, අධ්‍යාපනය, ආරක්ෂාව, සුරක්ෂිතභාවය මේ සියල්ලම අතිශයින්ම අවදානම් තැනකට තල්ලුවෙලා තියෙනවා. එපමණක් නොවේ. ඔහු උත්සාහ කරනවා කියන්න, ආර්ථික ස්ථාවරත්වයෙන් පස්සේ ආර්ථික වර්ධනය දක්වා යන ඒ අලුත් මාර්ගයේ නායකත්වය දෙන්න පුළුවන් තමන්ට විතරයි කියන්න ඔහු උත්සාහ කරනවා. ජනාධිපති පාවිච්චි කරන්නේ අලුත් මාවතක්ද? නැද්ද? කියන එක පරික්ෂාවට ලක්විය යුතුයි.

> ඇත්ත වශයෙන් ඔහු ප්‍රජාතන්ත්‍රවාදයේ හොඳම නියෝජිතයා හැටියට පෙන්නුම් කරන්න කොතෙක් උත්සාහ කළත් ඔහුගේ දේශපාලන භාවිතය තුළ ඔහු හැම විටම සිටගෙන තියෙන්නේ ප්‍රජාතන්ත්‍ර විරෝධී මැදිහත්වීම් වෙනුවෙන්. වචනවලින් මොනවා කිවුවත් ඔහු ජාතිවාදී අවස්ථාවලට මැදිහත් වූ, දේශපාලන භාවිතය තුළ ජාතිවාදය වපුරපු කෙනෙක්. අතිශයින්ම දූෂිත දේශපාලන සංස්කෘතියක් ආරක්ෂා කරපු, ඒ වෙනුවෙන් පෙනී සිටපු කෙනෙක්.

### සුරංගනා කතා

අපි දකින විදියට නම් මේ රට මේ අර්බුදයට ගෙන ගිය දේශපාලන සමාජ දෘෂ්ටිවාදයේ හොඳම නියෝජිතයා ජනාධිපති වික්‍රමසිංහයි. ඉතින් ඔහු අලුත් මාවතක් නියෝජනය කරන්නේ කියන එක බරපතළ ප්‍රශ්නයක්. අපි පොඩ්ඩක් කල්පනා කළොත් ඔහු 1977 සිට දේශපාලනයේ නිරතවෙලා විටින් විට බලය හෙබවපු පුද්ගලයෙක් විදියට ඇත්ත වශයෙන් මොකක්ද ඔහු නියෝජනය කරන්නේ. මොකක්ද ඔහු නියෝජනය කරපු දෘෂ්ටිවාදය සහ දේශපාලන දැක්ම? ඔහු නියෝජනය කරන්නේ, තමන්ගේ පවුල්වාදය සහ මිත්‍ර කණ්ඩායම්වලට



ජාතික ජන බලවේගය පාර්ලිමේන්තු මන්ත්‍රී
**ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය**

විශේෂ වරප්‍රසාද දෙන එක ස්ථාපිත කරන, ප්‍රචණ්ඩත්වය දේශපාලනයේ අන්තර්ගතයක් බවට පත්කරන දේශපාලන සංස්කෘතියක්. ඔහුගේ දේශපාලන විරුද්ධ වාදීන්ට එරෙහිව මර්දනය දියත් කළා. ඇත්ත වශයෙන් ඔහු ප්‍රජාතන්ත්‍රවාදයේ හොඳම නියෝජිතයා හැටියට පෙන්නුම් කරන්න කොතෙක් උත්සාහ කළත් ඔහුගේ දේශපාලන භාවිතය තුළ ඔහු හැම විටම සිටගෙන තියෙන්නේ ප්‍රජාතන්ත්‍ර විරෝධී මැදිහත්වීම් වෙනුවෙන්. වචනවලින් මොනවා කිවුවත් ඔහු ජාතිවාදී අවස්ථාවලට මැදිහත් වූ, දේශපාලන භාවිතය තුළ ජාතිවාදය වපුරපු කෙනෙක්. අතිශයින්ම දූෂිත දේශපාලන සංස්කෘතියක් ආරක්ෂා කරපු, ඒ වෙනුවෙන් පෙනී සිටපු කෙනෙක්.

ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරද්දී ඔහු දූෂණයට එරෙහිව අපි සියලු දෙනාටම එකතු වෙන්න කියන ආරාධනාව කළා. ඔහුගේ දේශපාලන අරමුණත් අපට තේරෙනවා. අපි බබ්බු නොවේ නේ. ඕනෑම ආණ්ඩුවක් දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වෙනවා නම් ඒ සඳහා මැදිහත් වෙනවා නම් අපි ඔවුන් සමග කටයුතු කරන්න සූදානම්. ඒ ගැන කිසි තර්කයක් නෑ. ඒ පදනමේ ඉඳගෙන තමයි 2015දී වුණත් එවැනි යහපාලන ආණ්ඩුව එක්ක යම් මැදිහත්වීමක් සාකච්ඡාවක් ආරම්භ කළේ. ඇත්තටම යහපාලන ආණ්ඩුව පොරොන්දු වුන විදියට දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වෙයි කියලා.

නමුත් දින 52ක් යන්න ඉස්සෙල්ලා යහපාලන ආණ්ඩුව තමා මහ බැංකුවේ මංකොල්ලය කළේ. ලංකාවේ සිදුවූ විශාලම දූෂණය ඔහුගේ නායකත්වය යටතේ සිද්ද වුනා. ඒක මුළු රටම දන්නවා. රනිල් වික්‍රමසිංහට ආරක්ෂා කරන්න ඕනැ වුණු රවි කරුනානායක, පී. හැරිසන් අයගේ විමර්ශන පටන් ගන්න කොට තමා දූෂණ විරෝධී කටයුතු අඩපණ වෙන්න පටන් ගත්තේ. ඔහුගේ දේශපාලන මැදිහත්වීම තුළින් දූෂණ විරෝධී ක්‍රියාවලිය හරියට ක්‍රියාත්මක නොකරන්න සෘජුවම මැදිහත් වුණ බව මේ මුළු රටම දන්නවා. එවැනි නායකයන් සමග අපට දූෂණයට එරෙහිව ක්‍රියාකරන්න කිසිසේත්ම හැකියාවක් නැහැ.

---

## ජනතාව දේශපාලන... 03 පිටුවෙන්

ජනමතය මාලිමාව වටා ගොඩනැගිලා ඉවරයි. මොන සෙල්ලම් දැම්මත් දැන් වැඩක් නැහැ. ජනතාව දේශපාලන වෙනසක් ඉල්ලා සිටිනවා. ආර්ථිකයේ සැබෑ වෙනසක් රටේ ජනතාව අපේක්ෂා කරනවා. ඇත්තටම යුග පෙරළියක වුවමනාවක් රටේ ජනතාවට තිබෙනවා. වසර 76ක් තිස්සේ ආපු දූෂණයෙන්, වංචාවෙන් පිරුණු ක්‍රමය වෙනස් කරන්න ජනතාවට ඕනකමක් තිබෙනවා. නිෂ්පාදනය මත පදනම් වූ ආර්ථිකයක් හදන්න ජනතාවට ඕනකමක් තිබෙනවා. ඒ නිසා සහන මලු බෙදලා, පුරුදු පරිදි ජනතාව රවට්ටලා, ජනමතය වෙනස් කරලා නැවත බලයට එන්න මේ දූෂිතයන්ට ඉඩක් නැහැ. ඔවුන් විවිධ වූ උපක්‍රම යොදන්නේ පරණ රැවටිල්ලට. නමුත් මෙවර එයින් පලක් වෙන්නේ නැහැ.

***මේ වන විට දේශපාලනය උණුසුම් වෙමින් කඳවුරු බෙදීමක් නිර්මාණය වෙමින් තිබෙනවා. මේ තත්වය පිළිබඳ ඔබේ කියවීම කවරාකාරද? මේ තුළ ජනතාවට කරන මඟ පෙන්වීම කුමක්ද?***

අද වෙනකොට විවිධ සන්ධාන අලුතෙන් ගොඩනැගිලා. විවිධ කණ්ඩායම්වලට බෙදිලා වෙන්වෙලා හිටපු අය දැන් නැවත විවිධාකාරයේ කඳවුරු බඳින්න පටන්ගෙන තිබෙනවා. නයි-මුගටි එක කොටේට ගොඩවෙන්න පටන්ගෙන තිබෙනවා. මේ වෙන මොකක්වත් නිසා නොවෙයි. ඉතිහාසයේ පළමුවෙනි වතාවට මේ රටේ දුක්විඳින ජනතාව නියොජනය කරන දේශපාලන කණ්ඩායමක් අතට බලය මාරුවෙනවා. මේක හුදෙක් ආණ්ඩු මාරුවක් නොවෙයි; මේක පැහැදිලිවම මේ සමාජ ක්‍රමයේ වෙනසක්. ඒ වෙනස සිදුවෙන්න යනවා දකින කොට මේගොල්ලෝ බයවෙලා තිබෙනවා. රනිල්ලා - චන්ද්‍රිකාලා - රාජපක්ෂලා - ප්‍රේමදාසලා වගේම ඒගොල්ලත් එක්ක ඉන්න විවිධ දූෂිතයන්ට, වංචාකරුවන්ට, මංකොල්ලකරුවන්ට අද යන එන මං නැතිව අනාථ වෙලා ඉන්නවා. ඒවගේම දේශපාලනයේ අනාථ වූ තවත් කණ්ඩායම් ගොඩක් ඉන්නවා. පසුගිය කාලයේ රාජපක්ෂ වලව්වල වළං හෝදපු අය, අද ඒ වලව්වලින් එළියට විසිවෙලා පාරට වැටිලා යන එන මං නැතිව ඉන්නවා. එයාලටත් ගොඩවෙන්න තැනක් ඕනැ වෙලා තියෙනවා.

මෙන්න මේ හැමෝම අද විවිධ කතා කියමින් එකට එකතු වෙන්න උත්සාහ දරනවා. එක කඳවුරකට ගොඩවෙන්න හදනවා. ඒක බොහොම හොඳ තත්වයක්. ජනතාවට පැහැදිලි තීරණයක් ගත හැකියි. මෙවර මැතිවරණය ගල උඩ සටනක්. ද්වන්ධ සටනක්. දූෂිතයෝ, වංචාකාරයෝ, රට බංකොලොත් කරපු කට්ටිය එක පැත්තක. මේ රට ගොඩනගන, අදූෂිත, ප්‍රගතිශීලී දේශප්‍රේමී කණ්ඩායම මේ පැත්තේ. කඳවුරු දෙකයි; ගොඩක් නැහැ. දූෂිතයන්ගේ පෙළයි, අදූෂිතයන්ගේ පෙළයි. රට වට්ටපු පිලයි. රට ගොඩනගන පිලයි. දැන් තරගය උත්සන්න වෙමින් යන්නේ ඒ පිල් දෙක අතරයි. තැන් තැන්වල විවිධ වෙස්මුහුණු බැඳගෙන වෙන්ව සිටි කණ්ඩායම් දැන් එකගොඩකට එකට එකතු වෙනවා. කඳවුරු දෙකේ ද්වන්ධ දේශපාලන සටන තමයි මෙවර ජනාධිපතිවර සටන. අපි ඒ සටනට මුහුණ දෙන්න ලැහැස්තියි. අනිවාර්යයෙන්ම ඒ සටනෙන් ඉතිහාසයේ පළමුවෙනි වතාවට මේ රටේ ප්‍රගතිශීලී දේශමාමක ජනතාව මාලිමාව ජයග්‍රහණය කරවනවා.

## රනිල්ගේ පාර්ලිමේන්තු.. 07පිටුවෙන්

පරිස්සමින් ගත යුතුව ඇත. 2023 දී 28%ක් වූ සාමාන්‍ය වෙළඳපොළ පොලී අනුපත දැන් 12%ක් වී ඇති බව ඇත්තය. ඒ, ආර්ථිකයේ ප්‍රගතියක් නිසා මූල්‍ය වෙළඳපොළ ස්ථාවර වීමේ ප්‍රතිඵලයක් නිසා නොව මූල්‍ය වෙළඳපොළ කඩා වැටීමේ ප්‍රතිඵලයකි. අද බැංකුවල ණය ඉල්ලුම අඩුවී ඇත. තැන්පතු අඩුවී ඇත. බැංකුවල පොලී ගෙවීම ඉතාම පහළට වැටී ඇත. ඒ නිසා අර්ථසාධක හිමියන්, විශ්‍රාමිකයන් බරපතළ ලෙස ජීවත්වීමේ ගැටලුවකට මුහුණදී ඇත.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට දැන් බැංකු පොලී තැන්පතු සඳහා ලැබෙන්නේ 9%කි. බැංකු ගනුදෙනු ක්‍රියාවලියේදී ඒ ලැබෙන 9%ක පොලී ආදායමට මහ බැංකුව 5%ක පොලියක් රඳවා ගැනීමේ බදු ලෙස අයකර ගනී. රු. 100ක තැන්පතුවකට රු. 9ක පොලියක් හිමිවුවද එම රු. 9 න් 5%ක් නැවත ආණ්ඩුව අයකර ගනී. රනිල් පොලී අනුපාත අඩුවී ඇතැයි කයිවාරු දෙසන්නේ මේ මංකොල්ලය සඟවමිනි.

රනිල් අපූරු කථාකරුවෙකි. ඔහුට හිතේ හැටියට කථා කිරීමට ඇති තැන්වල ඔහු කථා කියයි. නමුත් මහපොළොවේ යථාර්ථය ඊට සපුරා වෙනස්ය. රනිල්ගේ නවවැනි පාර්ලිමේන්තුවේ පස්වෙනි කථාව මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කෑ හැටි සිහිපත් කරයි.

එක් අතකින් පාර්ලිමේන්තුවේ ඔළුගෙඩි බය කරගනිමින් තමන්ට නතුකර ගැනීමට උත්සාහ කරන වෙනස් වූ ජනතාව වෙනස් කර ගැනීමට ඔප්පු බෙදීමේ වැඩසටහන, නැති රට රැකියා බෙදීමේ උත්සාහය, වෙනම කාර්යාලයක් මගින් සමෘද්ධිය වෙනුවට අස්වැසුම බෙදීම, හාල් කිලෝ 20ක් දීම වැනි කලින් රාජපක්ෂලා බඩු බෙදමින් කළ රැවටීමේ දේශපාලන සූදුවද ඔහු ආරම්භ කර ඇත. නමුත් රනිල් රාජපක්ෂ කඳවුරට පමණක් නොව ඒ පන්නයේ කවර හෝ රැවටිලිකාරයෙකුට, රැවටිලිකාර කණ්ඩායමකට එරෙහිව පෙළගැසී ඇති ජන බලවේගය මේ කිසිදු රැවටිල්ලකින් ආපසු හැරවිය නොහැකි බව නම් දැන් මනාව තහවුරුය.


# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com



යුරෝපා සංගමයේ තානාපතිනිය හමුවී...



එස්.ජී. පුංචිහේවා මහතාගේ පුස්තකාලය භාරගෙන...



බ්‍රිතාන්‍ය රාජ්‍යතාන්ත්‍රිකයින් හමුවී...



ගැහැනු එක මිටට - ගම්පහ




ජල සම්පත මිල කිරීමට එරෙහිව...




විසඳුම වෙනුවෙන් ධීවර බලය ගොඩනගා...

## ජයග්‍රහණය තෙක් නොසැලී ඉදිරියට යමු



ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා

ඉන්දියාවෙන් නිල ආරාධනය ලැබුණේ තිදෙනෙක් පමණක් පාර්ලිමේන්තුව නියෝජනය කරන ජාතික ජන බලවේගයට බවත් එසේ වූයේ ජනතාවගේ බලය ඇත්තේ එයට බව සනාථ වී ඇති නිසා බවත් බලය ලබාගැනීමෙන් පසුව එය ආරක්ෂා කර, ශක්තිමත් කරමින් ඉදිරියට ගෙනයාමේ හැකියාව තිබෙන්නේ ජනතාවට බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා, දීර්ඝ කාලයක් ජනතාව අතර තිබූ සුබ ප්‍රාර්ථනාවන් මල් එල ගැනීමේ ආසන්නයට රට පැමිණ සිටින බවත් එම ජයග්‍රහණය තෙක් නොසැලී ඉදිරියට යාමට සියලු දෙනාට ඇරයුම් කරන බවත් ප්‍රකාශ කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 18වැනි දින විශාල කාන්තා සහභාගිත්වයකින් යුතුව පැවති කුරුණෑගල දිස්ත්‍රික් NPP කාන්තා සමුළුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

ලංකා ඉතිහාසයේ ලොකුම සන්ධාන දෙකයි හදලා තිබෙන්නේ. රනිල්ලාට විරුද්ධව රාජපක්ෂලා හැදූ සන්ධානයත් රාජපක්ෂලාට විරුද්ධව රනිල්ලා හැදූ සන්ධානයත් කියන දෙකයි. දැන් ඒ දෙකම එකතු වෙලා ජාතික ජන බලවේගයට විරුද්ධව සන්ධාන හදලා තිබෙනවා. ඊළඟ ජනාධිපතිවරණ වේදිකාවේ සාටකය දාගත් - මහින්ද, ටයිකෝට් දාගත් - රනිල්, ඔසරි ඇඳගත් - චන්ද්‍රිකා, තරු පටි ගහගත් - ගෝඨාභය, පොළොන්නරුවේ ගැමියා - මෛත්‍රීපාල සිරිසේන, විකට ඇඳුම් තරගයක් වගේ දකින්න පුළුවන්. දැන් සාකච්ඡා යන්නේ සජිතුයි රනිලුයි එකතු කරන්නේ කොහොමද කියලා. ගමේ ඡන්ද පෙට්ටිය මාලිමාවට පිරෙව්වොත් ඔය කවුරු එකතු වුණත් වැඩක් නැහැ.

මේ දක්වා දේශපාලනය තිබුණේ පිරිමින්ගේ වැඩක් විදිහටයි. අද ලංකාවේ දේශපාලනය තිබෙන්නේ ගමේ සක්‍රීයම ගැහැනුන් අතේ. අලියෙක් ගැහුවාම ඉස්සෙල්ලාම ඒ ගෙදරට යන, මරණාධාර සමිතියට යන, ක්ෂුද්‍ර මූල්‍ය සමිතියට යන, පාසල් සමිතියට යන, පෝයදාට සිල් ගන්න, සක්‍රීයම කණ්ඩායම දැන් ඉන්නේ ජාතික ජන බලවේගය වටායි. එළඹෙන ඕනෑම මැතිවරණයකින් මේ රටත් ජනතාවත්, විනාශකාරී මාවතෙන් මුදා ගන්නා ක්‍රියාමාර්ග වෙනුවෙන් පෙරට එමු. ඡන්දයෙන් කරන්නේ විනාශකාරිත්වය පළවා හැරීම වගේම රට ගොඩනැගීමේ ආරම්භය ගැනීමයි. කුඩා වුණත් දැවැන්ත බලයක් තිබෙන මේ රට ගොඩනගන්න පුළුවන්. දරුවන්ට අධ්‍යාපනය, සෞඛ්‍යය, ආහාර, මානසික නිදහස, මූලික වශයෙන්ම ආරම්භයේදී ගොඩනගනවා. ඉදිරි මාස හතයි තිබෙන්නේ. ඒ මාස හත තුළ අධිෂ්ඨානයෙන් වැඩකර ශක්තිමත් බලයක් ගොඩනැගිය යුතුයි. ඒ බලය තිබෙන්නේ ජනාධිපති අතේවත් පාර්ලිමේන්තුව අතේවත් නොවෙයි; ඔබ අතෙයි. මොන අවලාද ආවත් කුමන තර්ජන ආවත්, අපි මෙය ජයග්‍රහණයෙන් කෙළවර කරනවා කියන අධිෂ්ඨානයෙන් වැඩ කරමු.

## සැබෑ නිදහස ලබා ගැනීමට නව පන්නයේ නිදහස් අරගලයක් අවශ්‍යයි



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

නිදහස යනුවෙන් ප්‍රකාශ කර මුහුදට වෙඩි තබා මාළුන් බියවද්දා ජාතික ධජය එසවීමෙන් නිදහස ලැබේදැයි ප්‍රශ්න කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, රටේ මූල්‍ය ප්‍රතිපත්ති තීරණය කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල බවත් රටේ ස්වාධීනත්වය, අයිතිය පුරවැසියන්ට අහිමි කර ඇති බවත් ගොවීන්ට ඉඩම් ඔප්පු දීම සඳහා යැයි දඹුල්ලට ගෙන්වන අතරතුර රජය සතු කිරි ගොවිපොළවල් අමුල් සමාගමට විකිණීමට සූදානම් වන බවත් හම්බන්තොට වරාය, කොළඹ වරායේ ජැටි, තෙල් ටැංකි දැනටමත් විකුණා තිබෙන බවත් පෙන්වා දුන් අතර මෙම තත්වය තුළ රට නිදහස් නොමැති බවත් මේ තත්වයන්ට එරෙහිව සැබෑ නිදහස ලබාගැනීම වෙනුවෙන් නව පන්නයේ නිදහස් අරගලයක් අවශ්‍ය වී ඇති බවත් අවධාරණය කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 17වැනි දින මාතලේ දිස්ත්‍රික් NPP කාන්තා සමුළුව අමතමිනි. මෙහිදී තවදුරටත් අදහස් පළ කළ ටිල්වින් සහෝදරයා, මෙසේද පැවසීය.

තව මාස අටකින් විතර අපේ යුගය නිර්මාණය වීමේ ආරම්භක ජනාධිපතිවරණය පැමිණෙනවා. ජනාධිපතිවරණය කල්දාන්න වංගු ගහන්න බැහැ. එහෙම වංගු ගහන්න කවුරු ඉඩ දුන්නත් අපි ඉඩ නොදෙන බව සහතික කර කියනවා. වංගු ගහන්න ආවොත් පාරට බැහැලා ඒගොල්ලන්ව එලවා දාන්න කාන්තාවන් එක මිටට පෙරමුණ ගන්නා බව සහතිකයි.

රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුව අමතා කීවේ 2048 දී රට ගොඩනගන්න අවස්ථාව දෙන්න කියලා. රනිල් වික්‍රමසිංහගේ ප්‍රධාන ගෝලයෙක් වන වජිර අබේවර්ධන කීවා 2048දී රට හැදිලා, යුරෝපයේ සුදු කාන්තාවෝ මෙහෙ ගෘහ සේවයට එන බව. මාතලේ දිස්ත්‍රික්කයේ සහෝදරියන් දහස් ගණනක් මේ ඇවිත් ඉන්නේ රට වට්ටපු උන් එළවලා රට ගොඩනගන්න ලැහැස්තියි කියන පණිවිඩය දෙන්නයි. හාල් මල්ලක් බෙදලා ඡන්ද එකතු කරන්නත් රනිල් උත්සාහ කරනවා. හාල් මල්ලකට, ටකරන් තහඩුවකට, ඡන්දය දීලා ආණ්ඩු හැදූ යුගය අවසන් බව අපි එයාට කියන්න ඕනෑ. මේක අලුත් යුගයක්, මාලිමාවේ යුගයක්. හාල් නොවෙයි රත්තරන් බෙදුවත් මේ රටේ කාන්තාවන් මාලිමාව ජයග්‍රහණය කරවන්න සූදානම් කියන තීන්දුව අරගෙනයි ඉන්නේ.

කාටත් සතුටින් ජීවත් විය හැකි සමාජයක් ගොඩනැගීමේ ප්‍රධාන කොටස්කරුවන් වීමේ සතුට ඔබ සැමට තිබෙනවා.

## මනුෂ්‍යත්වය ගොඩනගන සමාජයක් බවට අපි පත්විය යුතුයි



ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය

මානවයා තනියෙන් ජීවත් විය හැකි අයෙක් නොවන බවත් බැඳීම් අවශ්‍ය බවත් කෑම බීම තිබුණද මානව දයාව, හැඟීම් නොමැතිනම් ජීවිතය අර්ථවත් නොවන බවත් මිනිසුන් යන්ත්‍ර බවට පත් වන බවත් පෙන්වා දුන් ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය, ආර්ථික, සෞඛ්‍ය, අධ්‍යාපන දියුණුව මෙන්ම සහකම්පනය මනුෂ්‍යත්වය, සාමූහික වගකීම් ගොඩනගන සමාජයක් බවට පත්විය යුතු බව ප්‍රකාශ කළාය.

ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික හරිනි අමරසූරිය සහෝදරිය මේ අදහස් පළ කළේ පසුගිය 18වැනි දින පැවති කුරුණෑගල දිස්ත්‍රික් NPP කාන්තා සමුළුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කළ හරිනි අමරසූරිය සහෝදරිය මෙසේද පැවසුවාය.

අපේ සිහින සැබෑ කරගන්න පුළුවන් කියන විශ්වාසය අවශ්‍යයි. එකිනෙකා පිළිබඳ විශ්වාසය අපි තුළ තිබිය යුතුයි. ඒ තුළින් තමයි අපිට ඇත්ත සතුට ගෙනත් දෙන්නේ. ජීවිතයට ඇත්ත අර්ථයක් ගෙනැත් දෙන්නේ එවැනි දේ තුළින්. ගැහැනු අපට එය හොඳටම දැනෙන දෙයක්. ගැහැනු අපි එකතු වෙලා ඉන්නේ ඒ අරමුණු වෙනුවෙන්. අපට අහිමි කළ අපේ මනුෂ්‍යත්වය, තවදුරටත් උදුරාගන්න දෙන්න සූදානම් නැහැ කියන පණිවිඩය තමයි මේ දී තිබෙන්නේ. මනුෂ්‍යත්වයට ඉඩක් තිබෙන, සහකම්පනයට තැනක් තිබෙන සියලුම ජීවයන්ට, පරිසරයට වටිනාකමක් දෙන සමාජයක් අපට අවශ්‍යයි. අපේ ආණ්ඩුවක් යටතේ අපි හදන ජනතාවාදී පාලනයක් තුළ අපට අවශ්‍ය මොකක්ද කියන එක අපි තවදුරටත් සංවාද කරමු. ගැහැනුන්ට වටිනාකමක් දෙන, ගැහැනුන්ට ඇහුම්කන් දෙන, සහකම්පනය තිබෙන සමාජයක්, මානුෂීය සමාජයක් ගොඩනැගීමේ වගකීම අප සතුයි. දහසක් බලාපොරොත්තු සහ ඒ සිහින සැබෑ කරන්න ඒ වෙනුවෙන් අපි සියලු දෙනාම මහන්සි වී වැඩ කරමු. ඒ සඳහා ශක්තිය ධෛර්යය ඔබ සැමට පතනවා.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.